සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2025

# 51 - චිත්‍ර කලාව

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

[සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**විභාග අංකය** : ......................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**

– ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**

– එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**

– අනුකොටස් **තුනකින්** සමන්විත ය.

– '**අ**' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා '**ආ**' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

※ **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **කොටස** | **ලකුණු** |
| I | |
| II | |
| **එකතුව** | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |

**I කොටස**

● ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

1. නූතන කලා ප්‍රයෝග ඇසුරෙන් චිත්‍රනය වූ 'ජෛන භවන' සිතුවම කළ ශිල්පියා වනුයේ,
   (1) අයිවන් පීරිස් ය.
   (2) හැරී පීරිස් ය.
   (3) ඩබ්ලිව්. ජේ. ජී. බීලිං ය.
   (4) රිචඩ් ගේබ්‍රියල් ය.
   (5) එල්.ටී.පී. මංජු ශ්‍රී ය. (...**2**....)

2. මිසර චිත්‍ර නිර්මාණයේ දී මූලිකව ම අපේක්ෂා කරන ලද්දේ,
   (1) පාරාවරුන්ගේ ජීවන තොරතුරු වාර්තා කර තැබීමයි.
   (2) පාලකයන්ගේ බල පරාක්‍රමය පෙන්වීමයි.
   (3) පාරාවරුන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාස පෙන්වීමයි.
   (4) පාරාවරුන්ගේ යුධ ජයග්‍රහණ පෙන්වීමයි.
   (5) පාරාවරුන්ගේ දඩයම් දර්ශන පෙන්වීමයි. (...**1**....)

3. ගම්පොළ යුගයේ නිර්මාණය වූ බුදු පිළිම තුළ දක්නට ඇති සුවිශේෂී ලක්ෂණය වනුයේ,
   (1) ජ්‍යාමිතික හැඩැති සිරුර හා අධ්‍යාත්මික ගුණ නිරූපණයයි.
   (2) හින්දු කලා ලක්ෂණ අනුව විවෘත දෙනෙත් නිරූපණයයි.
   (3) පුළුල් දෙවුර හා පෞරුෂ ලක්ෂණ ආරෝපණය කිරීමයි.
   (4) රිද්මයානුකූල දියරැලි ආකාර චීවරය හා ප්‍රකාශනයයි.
   (5) කේතුමාලා සිරස්පත පොදු ලක්ෂණයක් ලෙස යොදා ගැනීමයි. (...**2**...)

[දෙවැනි පිටුව බලන්න



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

4. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ම සඳකඩ පහනේ පැවති, එහෙත් ක්‍රමිකව වෙනසකට ලක් වූයේ,
   (1) තීරු බෙදා වෙන් කළ ආකාරයයි.
   (2) අඩ නෙළුම පූර්ණ නෙළුමක් වූ ආකාරයයි.
   (3) කලා අංග ස්ථානගත කළ පිළිවෙලයි.
   (4) ගිනි දැල්ලේ ස්වරූපය හා ප්‍රමාණයේ වෙනසයි.
   (5) සත්වාවලියේ දිශානතියේ සිදු වූ වෙනසයි. (..2..)

5. ඉන්දිය මාමල්ලපුරම්හි පංච පාණ්ඩව රථ දේවාල අතර දෙමහල් රථය වන්නේ,
   (1) අර්ජුන රථයයි.
   (2) ධර්මරාජ රථයයි.
   (3) ද්‍රවුපදි රථයයි.
   (4) නකුල සහදේව රථයයි.
   (5) භිම රථයයි. (..5..)

● ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන වරණය 1** සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් පින්තූර ඇසුරෙන් තෝරන්න.


1


2


3


4


5


6


7


8


9

6. වාස්තු විද්‍යාත්මක අංගයන් ලෙස නිම කරන ලද කලා කෘති මොනවා ද?
   (1) **2,3,4** (2) **3,4,7** (3) **4,5,6** (4) **4,6,7** (5) **5,6,7** (..2..)

7. මිත්‍යා රූප ඇසුරෙන් කරන ලද කලා නිර්මාණ මොනවා ද?
   (1) **2,5** (2) **5,6** (3) **6,7** (4) **6,9** (5) **7,9** (..5..)

8. ඓතිහාසික පුරාවෘත්ත හා බැඳි නිර්මාණ මොනවා ද?
   (1) **1,3** (2) **1,5** (3) **1,6** (4) **3,6** (5) **6,8** (..3..)

9. නෙලීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් කළ නිර්මාණ මොනවා ද?
   (1) **1,2,4,5** (2) **1,2,4,7** (3) **1,2,6,9** (4) **1,3,6,9** (5) **4,6,8,9** (..4..)

10. වාත්තු ශිල්ප ක්‍රම පදනම් කරගෙන කළ නිර්මාණ මොනවා ද?
   (1) **2,5,6** (2) **2,5,8** (3) **5,6,7** (4) **6,7,8** (5) **7,8,9** (..2..)

- ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.



A



B



C



D



E

**11.** **A** අක්ෂරයෙන් දැක්වෙන ආලේඛ්‍ය සිතුවම,
(1) ජේ.ඩී.ඒ. පෙරේරා ශිල්පියාගේ ය.
(2) ස්ටැන්ලි අබේසිංහයන්ගේ ය.
(3) ජ්.සී.ජී.එස්. අමරසේකරයන්ගේ ය.
(4) හැරී පීරිස් ශිල්පියාගේ ය.
(5) ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ ය. (...1...)

**12.** **B** අක්ෂරයෙන් දැක්වෙන මේරි කසාට් ශිල්පිනියගේ සිතුවම තුළ,
(1) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ක්‍රමෝපායන් භාවිත කර ඇත.
(2) හුදකලාව හා විවිධ මානසික ව්‍යාකූලතා ඉස්මතු කර ඇත.
(3) වර්ණවල ඇති පසමිතුරුභාවය සංරචන උපක්‍රම ලෙස භාවිත කොට ඇත.
(4) සම්භාව්‍ය සංරචන ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.
(5) පසුබිම අත්‍යවශ්‍ය අංගයක් සේ නිරූපණය කර ඇත. (...3...)

**13.** **C** අක්ෂරයෙන් දැක්වෙන ජස්ටින් දැරණියගල ශිල්පියාගේ සිතුවම,
(1) නිරූපණාත්මක මෙන් ම ශෛලිගත ලක්ෂණ පෙන්නුම් කරයි.
(2) වස්තූන්ගේ ස්වභාවය ප්‍රකෘති ස්වභාවයෙන් ඉදිරිපත් කරයි.
(3) ප්‍රකාශනවාදී කලා ලක්ෂණ සහිත මධ්‍යගත සංරචනයකි.
(4) ශාස්ත්‍රාලයීය ශිල්ප ක්‍රමය අනුව කළ ප්‍රකාශනයකි.
(5) යථාරූපී මෙන් ම ඝණිකවාදී කලා ලක්ෂණ ද සම්මිශ්‍රිත ප්‍රකාශනයකි. (...3...)

**14.** **D** අක්ෂරයෙන් දැක්වෙන ඩබ්ලිව්.ජේ.ජී. බීලිං ශිල්පියාගේ සිතුවම,
(1) හැඩතල ද්විමාන ස්වරූපයෙන් තලය පුරා විසිරෙන සේ දක්වා ඇත.
(2) ස්වාභාවික හා නිර්මාණාත්මක හැඩතල සමූහයක් එකතුවෙන් කළ නිර්මාණයකි.
(3) විසංගත වර්ණ භාවිතයෙන් ප්‍රකෘති ස්වභාවය විකෘති කර දක්වයි.
(4) නිශ්චල ද්‍රව්‍ය සමූහයක් ඝණිකවාදී ස්වරූපයෙන් කළ ප්‍රකාශනයකි.
(5) ද්විමාන හා ත්‍රිමාන හැඩතල අර්ථවත්ව එකට ගැළපීමකි. (...4...)

**15.** **E** අක්ෂරයෙන් දැක්වෙන අම්රිතා ශර්ගිල් ශිල්පිනියගේ සිතුවම,
(1) ශාස්ත්‍රාලයීය දැනුමෙන් පෝෂිත චිත්‍රමය භාෂාවකින් සමන්විත වූවකි.
(2) සම්භාව්‍ය වර්ණ මාලාවකින් සම්භාව්‍ය නොවන තේමාවක් හැඩ කිරීමකි.
(3) ගැමි සංස්කෘතිය, ශෛලිගත ආකාරයකින් ගොඩනැංවූවකි.
(4) බහු වාර්ණික ස්වරූපයෙන් තේමාව අර්ථ දැක්වීමකි.
(5) නූතනවාදී කලා ප්‍රවේශය ශෛලිගතව ඉදිරිපත් කිරීමකි. (...2...)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.




F




G



H



I



J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන ඇම්බැක්කේ දේවාලයේ කැටයම
(1) මානව රූප කිහිපයක් දේශීය ලක්ෂණ සහිතව කළ නිර්මාණයකි.
(2) දැව කැටයම් ශිල්පියාගේ විශිෂ්ටත්වය දැක්වෙන නිර්මාණයකි.
(3) දැව මාධ්‍යයේ ස්වභාවය ඉස්මතුවන ආකාරයට කරන ලද්දකි.
(4) පනේලය තුළ කළ විරල තේමා සංරචනයකි.
(5) සමකාලීන සමාජයීය තේමාවක් අල්ප උන්නතව දැක්වීමකි.
(....5....)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන්නේ
(1) නාටිකාංගනාවන් නිරූපිත පනේල කැටයමකි.
(2) ආගමික පෙරහැරක් දැක්වෙන පනේල කැටයමකි.
(3) ගඩලාදෙණිය ද්වාර මණ්ඩපයේ දක්නට ඇති අල්ප උන්නත කැටයමකි.
(4) යාපහුව රාජමන්දිරයේ පාදමේ දක්නට ඇති පනේල කැටයමකි.
(5) නටන වයන කාන්තා රූ ඇතුළත් පනේල කැටයමකි.
(....4....)

**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන සාංචි තොරණේ
(1) බෞද්ධාගමික පුවත් කැටයමට නගා ඇත.
(2) බුද්ධ චරිතයේ සිද්ධි ඇසුරෙන් පමණක් උඩලිපත් කැටයම් කර ඇත.
(3) සිරස් කුලුණු කැටයම් කර ඇත්තේ ඓතිහාසික පුවත් ඇසුරෙනි.
(4) සංකේත භාවිත කොට බුදුසිරිතේ සිද්ධි නිරූපණය කර ඇත.
(5) උඩලිපත් කැටයම් අඛණ්ඩ කථන ක්‍රමයෙන් කර ඇත.
(....4....


**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන අමරාවතියේ නාලාගිරි දමනය කැටයම
(1) ශිල්පියාගේ භාව ප්‍රකාශන හැකියාව මනාව ඉස්මතු කළ විශිෂ්ට පනේල නිර්මාණයකි.
(2) තලය පුරා මානව හා සත්ත්ව රූප විසිරී යන පරිදි කළ කැටයමකි.
(3) ඇත් රුව දෙවතාවක් යෙදීම මගින් ඒකකාරී සම්පිණ්ඩනයක් පෙන්නුම් කරන්නකි.
(4) ජීවය හා ක්‍රියාකාරීත්වය අවම මට්ටමක නිරූපිත වෘත්තාකාර පුවරුවකි.
(5) ශිල්පියාගේ සංකේත භාවිතය ඉතා ඉහළ මට්ටමින් පෙන්වන නිර්මාණයකි.
(....1....

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) රෝමවරු තම යුධ ජයග්‍රහණ පුවත් යොදා කළ ආරුක්කු කැටයමකි.
(2) ජෙරුසලම වටලෑම දැක්වෙන රෝම ආරුක්කු කැටයමකි.
(3) රෝම වාස්තුවිද්‍යා නිර්මාණයක් අලංකාර කළ කැටයමකි.
(4) ඩේසියානු හමුදාවේ පරාජය දැක්වෙන ආරුක්කු කැටයමකි.
(5) කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ දැක්වෙන ආරුක්කු කැටයමකි.
(..5....

- ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රකාශයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.



K



L



M



N



O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,

(1) මහාරාජ ලීලාවෙන් වැඩ හිඳින බෝසත් රුවකි.
(2) පොළොන්නරුවෙන් හමුවූ පද්මපානි බෝසත් රුවයි.
(3) අනුරාධපුර අවසාන භාගයේ දී හමුවූ අවලෝකිතේශ්වර බෝසත් රුවයි.
(4) හින්දු ආගමික බලපෑම් මත, වාත්තු ශිල්ප ක්‍රමය අනුව කළ ලෝකඩ පිළිමයකි.
(5) කුහර වාත්තු ක්‍රමයෙන් නිමකර රන් ආලේපිත පිළිමයකි. (...3...)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන හෙන්රි මුවර්ගේ මූර්තිය,

(1) ශාස්ත්‍රාලයීය යථාරූපීකරණය විකෘති කිරීමකි.
(2) උද්‍යාන මූර්තියක් සඳහා ලෝකඩ මාධ්‍යයෙන් කළ නිර්මාණයකි.
(3) වැතිරී සිටින කාන්තාවකගේ ස්වරූපය අනුව කළ ප්‍රකාශනයකි.
(4) කාන්තාබව නිරූපණය කෙරෙන හැඩතල සංරචනයකි.
(5) කුහරමය අවකාශය තුළින් පරිසරය හා බැඳී දෘශ්‍යමය වූ ප්‍රකාශනයකි. (...5...)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන ඩේවිඩ් ප්‍රතිමාව නිර්මාණයේ දී ශිල්පියා වඩාත් අවධානය යොමුකළේ,

(1) මානව කාය ව්‍යූහ ලක්ෂණ පිළිබඳ ඔහු සතු විශාරදබව පෙන්නුම් කිරීමට ය.
(2) සැහැල්ලු, නිදහස් හා රිද්මයානුකූල හැඩ ගොනු කිරීමට ය.
(3) කිරිගරුඬින් අනාබද්ධව හෙලනිස්ටික් යුගයේ පරමාදර්ශී ලක්ෂණ එක්කිරීමට ය.
(4) වීරයකු සතු පෞරුෂ ලක්ෂණ සහිත බලයේ සංකේතයක් නිර්මාණයට ය.
(5) තීක්ෂණ හා කල්පනාකාරී බැල්ම සහිත මානවවාදියෙකු නිර්මාණයට ය. (...4...)

**24.** **N** අක්ෂරයෙන් නිරූපිත මයිකල් ආන්ජිලෝගේ මෝසස් පිළිරුව නිර්මාණයේ අරමුණ වන්නේ,

(1) ගල් පුවරුවක් සහිත නිර්මාණයක් තුළින් දසපනත සංකේතවත් කිරීමයි.
(2) II වන ජූලියස් පාප්වහන්සේගේ සොහොන් කොත සංකේතවත් කිරීමයි.
(3) සිස්ටයින් දෙව්මැදුර තුළ ග්‍රීක සම්භාව්‍ය කලාවේ මූර්තිමය ලක්ෂණ දෘශ්‍යමාන කිරීමයි.
(4) භාව ප්‍රකාශනය මගින් ප්‍රඥාවේ මහිමය පෙන්වීමයි.
(5) දූරදර්ශී, දේහධාරී පඬිවරයෙකු නිරූපණය කිරීමයි. (...1...)

**25.** **O** අක්ෂරයෙන් නිරූපිත ඊජිප්තු පිළිරුව,

(1) මිසර පැරණි රාජධානි යුගයට අයත් හුනු ගලින් නිර්මිත මූර්තියකි.
(2) සාම්ප්‍රදායික ලක්ෂණයන්ගෙන් මිදුනු නව රාජධානි යුගයේ මූර්තියකි.
(3) රාජකීයයකුගේ සේවකයකු නිරූපණය කරන්නකි.
(4) ලිවීමේ උපකරණ රැගත් ලියන්නකු නිරූපිත කැටයමකි.
(5) මධ්‍ය රාජධානි යුගයේ ක්‍රියාකාරීත්වය නිරූපිත මූර්තියකි. (...1...)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**26.** පහත දැක්වෙන සිත්තරුන් හා බැඳි කලා ව්‍යාපාර නිවැරදි අනුපිළිවෙළින් දක්වන්න.

**ජෝජස් බ්‍රාක්, එඩ්ගා ඩෙගා, සැල්වදෝර් ඩාලි, වසිලි කැන්දිනෙස්කි හා වින්සන්ට් වැංගෝ**

(1) වියුක්තිවාදී, පශ්චාත් උපස්ථිතිවාදී, ඝණිකවාදී, උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී
(2) උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී, පශ්චාත් උපස්ථිතිවාදී, වියුක්තිවාදී, ඝණිකවාදී
(3) පශ්චාත් උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී, ඝණිකවාදී, වියුක්තිවාදී, උපස්ථිතිවාදී
(4) ඝණිකවාදී, උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී, වියුක්තිවාදී, පශ්චාත් උපස්ථිතිවාදී
(5) අධියථාර්ථවාදී, ඝණිකවාදී, පශ්චාත් උපස්ථිතිවාදී, වියුක්තිවාදී, උපස්ථිතිවාදී

(…**4**…)

**27.** පෝස්ටරයක් යනු,

(1) කිසියම් තේමාවක් සංකේතවත්ව ප්‍රකාශ කෙරෙන මාධ්‍යයකි.
(2) කිසියම් පණිවුඩයක් සරලව, නිරවුල්ව, වේගවත්ව කෙරෙන ප්‍රචාරණ මාධ්‍යයකි.
(3) කාලීන තේමාවක් සිත්ගන්නා අයුරින් සමාජගත කෙරෙන ප්‍රබල දෘශ්‍ය මාධ්‍යයකි.
(4) සන්නිවේදන ක්‍රියාවලියේ වේගවත් ම ප්‍රචාරණ මාධ්‍යයයි.
(5) සංකීර්ණ තේමාවක් මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රකාශ කෙරෙන සන්නිවේදනයකි.

(…**2**…)

**28.** යථාර්ථවාදය යනු,

(1) පර්යාලෝකය සහ ත්‍රිමාණ ලක්ෂණ යනාදී දෘශ්‍ය කලා මූලධර්ම නිවැරදිව ප්‍රකාශ කිරීමයි.
(2) ප්‍රකෘති ලෝකයේ ස්වභාවික හා නිර්මිත වස්තූන් ඇති සැටියෙන් චිත්‍රණය කිරීමයි.
(3) බටහිර ලෝකය හඳුන්වාදෙන ශාස්ත්‍රාලයීය මූලධර්ම සුරැකීමයි.
(4) යථා ලෝකයේ පවත්නා වස්තූන් වියුක්තරූපීව ප්‍රකාශ කිරීමයි.
(5) වස්තූන්ගේ සැබෑ ස්වරූපය බහුවිධමානයෙන් නිරීක්ෂණය කොට ප්‍රකාශ කිරීමයි.

(…**2**…)

**29.** පශ්චාත් උපස්ථිතිවාදී නිර්මාණකරණයේ දී ශිල්පීන් වඩාත් අවධානය යොමු කරන ලද්දේ,

(1) උපස්ථිතිවාදී ශිල්පක්‍රම නවතාවයකින් යුතුව ඉදිරියට පවත්වාගෙන යාමටයි.
(2) ඒකාකාරීව පවත්නා උපස්ථිතිවාදී ශිල්පක්‍රම අතික්‍රමණය කිරීමටයි.
(3) නව අත්හදා බැලීම් හා ගැඹුරු භාව ප්‍රකාශන සහිත වස්තු විෂය ගවේෂණය කිරීමටයි.
(4) උපස්ථිතිවාදීන් භාවිත කළ ශිල්පක්‍රම වෙනුවට නව ශිල්ප ක්‍රම ගවේෂණය කිරීමටයි.
(5) වස්තූන් කෙරෙහි, ආලෝකය දක්වන ප්‍රතික්‍රියාව ගවේෂණය කිරීමටයි.

(…**3**…)

**30.** වියුක්තිවාදය සඳහා පදනම වී ඇත්තේ,

(1) හඳුනාගත හැකි රූපයකින් තොරව කෙරෙන දෘශ්‍ය ප්‍රකාශනයන් ය.
(2) පරිකල්පනීය අරමුණු සහ ගොඩනගාගත් වියුක්ත හැඩ ප්‍රකාශනයන් ය.
(3) ස්වභාවධර්මයේ දෘශ්‍ය රූප ප්‍රතිනිර්මාණය හා සරලීකරණය කිරීම ය.
(4) ස්වභාවධර්මය හෝ එහි වස්තූන් ඒ ආකාරයෙන් ම අනුකරණය හෝ ප්‍රතිනිර්මාණය හෝ අත්හැර දැමීම ය.
(5) රේඛා මගින් ගොඩනගන ලද චලනමය, නම්‍යශීලී හැඩ හා වර්ණ හැසිරවීම ය.

(…**4**…)

- ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.


**31.** ඇම්බැක්කේ දේවාලය වාස්තු විද්‍යාත්මකව වැදගත් වනුයේ,



(1) කතරගම දෙවියන් උදෙසා ඉදිකරන ලද නිසා ය.
(2) දෙල්මඩ මූලාචාරීන්ගේ විශිෂ්ට නිර්මාණයක් වීම නිසා ය.
(3) එහි පියස්ස නිර්මාණයේ දී යොදාගෙන ඇති නව නිර්මාණාත්මක අංග නිසා ය.
(4) දැව මාධ්‍යය කලාත්මක මුහුණුවරකින් භාවිතයට ගෙන ඇති ආකාරය නිසා ය.
(5) විවෘත මණ්ඩපයක් ලෙස ඉදිකර ඇති වාස්තු විද්‍යාත්මක සැලැස්ම නිසා ය.

(…**3**…)

**32.** මෙහි දැක්වෙන්නේ,




(1) අනුරාධපුර යුගයේ හත්ථිකුච්ඡි විහාර වටදාගෙයයි.
(2) මණ්ඩප දෙකකින් යුතු තිරියාය වටදාගෙයයි.
(3) පොළොන්නරුවේ දළදා මළුවේ දක්නට ඇති වටදාගෙයයි.
(4) ගල්කණු පේළි දෙකක් මත පියස්ස රඳවන ලද මැදිරිගිරිය වටදාගෙයයි.
(5) අනුරාධපුර යුගයේ අම්බස්තල වටදාගෙයයි.

(…**4**…)

[හත්වැනි පිටුව බලන්න


**33.** මෙහි දැක්වෙන රාජ රාජේශ්වර දේවාලය,



(1) චෝල ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව තන්ජෝරයේ ඉදිවූ දෙවොලයි.
(2) කළුගල් භාවිතයෙන් ඉදිකර ඇති ව්‍යුහාත්මක දෙවොලයි.
(3) 1 වන රාජ රාජ රජු විසින් ඉදිකරන ලද විශාලත ම දෙවොලයි.
(4) ගෝපුරය සහිත විමාන හා ශිඛරයකින් යුතු හින්දු දෙවොලකි.
(5) දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායයන් අනුව ගලින් ඉදිකළ දෙවොලකි.

(...1.....)

**34.** මෙහි දැක්වෙන්නේ,



(1) ක්‍රි.පූ. 2570 දී ඉදිකරන ලද විශාලතම පිරමීඩයයි.
(2) කාෆ්රේ රජු විසින් ඉදිකරන ලද දෙවන විශාලත ම පිරමීඩයයි.
(3) මිසරයේ විශාලතම පිරමීඩ ත්‍රිත්වය අතුරෙන් එකක් වන කුඩා පිරමීඩයයි.
(4) ඊජිප්තුවේ මධ්‍ය රාජධානි යුගයේ ඉදි වූ දෙවන විශාලතම පිරමීඩයයි.
(5) කාෆ්රේ පාරාවරුන්ගේ සොහොන් ගැබ ලෙස ඉදිකළ පිරමීඩයයි.

(....5...)


**35.** මෙහි දැක්වෙන්නේ,



(1) සමෝරා හේරා දෙවියන් වෙනුවෙන් කළ ඉරෙක්තියන් ගොඩනැගිල්ලේ අයොනික් කුලුණු ය.
(2) ඇතන්ස්හි සියුස් දෙවියන් වෙනුවෙන් කළ දෙවොලේ කොරින්තියන් කුලුණු ය.
(3) ඇතීනා දෙවඟන වෙනුවෙන් කළ පාතිනොන් දෙවොලේ ඩොරික් කුලුණුය.
(4) ඇතන්ස්හි සියුස් දෙවියන් වෙනුවෙන් කළ දෙවොලේ අයොනික් කුලුණු ය.
(5) ඇතීනා දෙවඟන වෙනුවෙන් කළ පාතිනොන් දෙවොලෙහි කොරින්තියන් කුලුණු ය.

(....2....)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** ලංකා කලා සංගමයේ, ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියා,

(1) පෙරදිග චිත්‍ර ශෛලීන් ගුරුකොට ගත් අයෙකි.
(2) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී රීතීන් අනුගමනය කළ අයෙකි.
(3) වෘත්තාන්ත චිත්‍රකරණයට ඇල්මක් දැක්වූවෙකි.
(4) සාම්ප්‍රදායික චිත්‍රවල ක්‍රමවේද අනුකරණය කළ අයෙකි.
(5) තමාට ම ආවේණික සම්ප්‍රදායයක් අනුගමනය කළ අයෙකි.

(....2....)



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**37.** මෙහි තේමාව තුළින් නිරූපණය කර ඇත්තේ,
(1) යථාර්ථවාදීව මානව රූ චිත්‍රණය කිරීමට ගත් උත්සාහයකි.
(2) මධ්‍යම පන්තියේ පවුල් ජීවිතය පිළිබඳ කළ විග්‍රහයකි.
(3) පීඩිත පන්තියේ දරිද්‍රතාව පිළිබඳ ප්‍රකාශ කිරීමකි.
(4) ග්‍රාමීය ජීවිතය පිළිබඳ සංකේතවත්ව කළ විග්‍රහයකි.
(5) ගැමි දිවියේ දුක්ඛිත අවස්ථාවක් ප්‍රතිනිර්මාණය කිරීමකි. (...**3**...)

**38.** සංරචනයේ මූලික අරමුණ වූයේ,
(1) මානව ඉරියව් සිද්ධියට අනුරූපව තත්ත්වාකාරයෙන් ගොනු කිරීමයි.
(2) මානව රූ මෙන් ම විවිධ වස්තූන් එකිනෙකට ගැළපෙන අයුරින් ඉදිරිපත් කිරීමයි.
(3) මානව රූපවලට වඩා ප්‍රකාශිත වස්තූන්ට ප්‍රමුඛතාවක් ලබාදීමයි.
(4) තේමාව විග්‍රහ කිරීමට අදාළව රූප ගණනාවක් සංකේතවත්ව භාවිත කිරීමයි.
(5) වර්ණ සංකලනය කිරීම තුළින් හැඟීම් ප්‍රකාශනයට මුල්තැනක් දීමයි. (...**4**...)

**39.** 'වඩුවාගේ ගෙදර' සිතුවමේ
(1) සමභාව්‍ය වර්ණමාලාවක් ප්‍රශස්ත ලෙස තෙල් සායම් මාධ්‍යයෙන් නිම කර ඇත.
(2) ස්වාභාවිකත්වය අනුකරණය කිරීම සඳහා උචිත වර්ණ යොදා ඇත.
(3) ආලෝකය හා අඳුර අතර ප්‍රබල ප්‍රතිවිරෝධතා මතුවන ලෙස වර්ණ භාවිත කර ඇත.
(4) බහුවාර්ණික ලක්ෂණ ඇති සමභාව්‍ය වර්ණ මාලාවක් භාවිත කර ඇත.
(5) වර්ණ භාවිතයේ දී පැහැයෙහි වෙනස්වීම පියෙවි පෙනුමෙන් මතු කර ඇත. (...**3**...)

**40.** හැඟීම ප්‍රකාශනය පිළිබඳ වඩාත් උචිත ප්‍රකාශය තෝරන්න.
(1) මධ්‍යම පාන්තික සමාජයේ දරිද්‍රතාව මානව රූවලින් ප්‍රකාශ කර ඇති අයුරු අගනේ ය.
(2) මානව රුව හැඟීම් ප්‍රකාශවන අයුරින් යොදා ගෙන ඇති අයුරු ප්‍රශස්ත ය.
(3) සංකේත භාවිත කරමින් ප්‍රකාශනය ඉස්මතු කිරීමට ගත් උත්සාහය අගනේ ය.
(4) යථාරූපීව, හැඟීම් දනවන අයුරින් මානව රූ ඇතුළු සමස්තය චිත්‍රණය කර ඇති අයුරු අගය කළ හැකි ය.
(5) මානව රූපවල බාහිර සුන්දරත්වය මෙන් ම අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනයට ගත් උත්සාහය විශිෂ්ට ය. (...**4**...)

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | |
|---|---|
| චිත්‍ර කලාව | I |
| சித்திரக்கலை | I |
| Art | I |

**51 S I**

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර යුගයේ ඇරඹි නව වාස්තු විද්‍යා ප්‍රබෝධය බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ රැසක් බිහිවීමට හේතු විය.
   (i) භික්ෂූන් වහන්සේලා සඳහා නිර්මාණය කරන ලද ඝර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) නිල්ලක්ගම බෝධිඝරය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05 යි)
   (iii) අනුරාධපුර ඉදිවූ කුට්ටම් පොකුණ සහ පොළොන්නරුවේ ඉදිවූ නෙළුම් පොකුණ අගනා ශෛලමය නිර්මාණයන් ය. ආකෘතිය හා ශිල්පීය කුසලතාව පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

2. ශ්‍රී ලංකාවේ ආගමික සිතුවම් නිර්මාණකරණයේ නියැලුණු චිත්‍ර ශිල්පීහු විවිධ තේමා යටතේ විශිෂ්ට නිර්මාණ බිහි කළෝ ය.
   (i) නාරායන ස්වාමි ශිල්පියා විසින් වැල්වැටිතුරෙයි මුත්තු අම්මාන් කෝවිලෙහි ඇඳ ඇති සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා විසින් සිතුවම් කරන ලද මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ දක්නට ලැබෙන 'යහපත් සමරිතානුවා' සිතුවම පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)
   (iii) 'මාර පරාජය' බෞද්ධාගමික චිත්‍ර ශිල්පීන් විසින් විවිධාකාරයෙන් සිතුවමට නගා ඇත. බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් ඇඳි ජෝර්ජ් කීට් ශිල්පියා හා බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් ඇඳි සෝමබන්දු විද්‍යාපති ශිල්පියා 'මාර පරාජය' සිතුවම් කළ ආකාරය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

3. පොළොන්නරු යුගයේ දී හින්දු ආගමික සංකල්ප මත පදනම්ව ආගමික මූර්ති ගණනාවක් දේවාල ආශ්‍රිතව නිර්මාණය කර ඇත.
   (i) හින්දු ආගමික මූර්ති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ශිව සෝමස්කන්ධ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)
   (iii) හින්දු ආගමික මූර්ති අතර නටරාජා මූර්තිය සුවිශේෂී වේ. එහි සංකේත භාවිතය හා කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

[පෙරළින් බලන්න



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. ගන්ධාර හා මථුරා ගුරුකුල බෞද්ධාගමික මූර්ති රැසක් ලොවට බිහි කළ කලා මධ්‍යස්ථානයන් ය.

(i) ගන්ධාර කලා සම්ප්‍රදායේ නිර්මාණය වූ ප්‍රතිමා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සඳහා ගන්ධාර කලා සම්ප්‍රදාය ඉවහල් වී ඇති ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 05 යි)

(iii) මථුරා හා සාරානාත් ගුරුකුලයන්හි නිර්මාණ ගුප්ත යුගයේ දී ඉතා උසස් තත්ත්වයට පත් විය. ඉහත කියමන සනාථ කිරීම සඳහා මථුරා හා සාරානාත් බුදු පිළිමවල ප්‍රශස්ත මූර්තිමය ලක්ෂණ හා භාව ප්‍රකාශන ඇසුරෙන් පහදන්න. (ලකුණු 08 යි)

5. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු ජන කොට්ඨාසයක් විසූ පෞරාණික ජනාවාසයකි.

(i) ඉන්දු නිම්න වැසියෝ කලා කෘති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉන්දු නිම්න වැසියෝ මානව රුව සියුම්ව අධ්‍යයනය කොට නිර්මාණය කිරීමට දක්ෂතා ඇත්තෝ වූහ. **එක්** උදාහරණයක් ගෙන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ඉතා දියුණු ගෘහ නිර්මාණ තාක්ෂණයක් පැවති බවට සාක්ෂි හමුවී ඇත. ඉහත කියමන ඔවුන්ගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08 යි)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. යුරෝපයේ තදාසන්න රාජ්‍යයන් දෙකක් වන ග්‍රීසිය හා රෝමය කලා නිර්මාණ රැසක් ලොවට දායාද කළ දේශයන් විය.

(i) ග්‍රීක සම්භාව්‍ය යුගයේ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) රෝම වාස්තු විද්‍යාවේ සුවිශේෂී නිර්මාණයක් වූ ට්‍රාජන් කුලුණ (The Trajan Column) ගැන කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ග්‍රීක හා රෝම ශිල්පීන් මානව රූපය, සිතුවම් සඳහා යොදා ගත් ආකාරය හා අවස්ථාවන් ඇසුරෙන් සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

7. ඉතාලියේ බිහි වූ පුනරුද සමය, අග්‍රගණ්‍ය කලා කෘති රැසක් ලොවට බිහිකළ අවධියකි.

(i) මයිකල් ඇන්ජලෝ විසින් නිර්මාණය කරන ලද සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පුනරුද කලාවේ පොදු ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)

(iii) ලියනාඩෝ ඩාවින්චිගේ 'පර්වත මස්තකයේ දේවමෑණියෝ' සහ රෆායෙල් සන්සියෝගේ 'ඇල්බා මැඩෝනා' යන සිතුවම් පිළිබඳ ආකෘතිය හා කලා ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

❊ ❊ ❊

## 'අ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** අනුරාධපුර යුගයේ ඇරඹි නව වාස්තු විද්‍යා ප්‍රබෝධය බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ රැසක් බිහිවීමට හේතු විය.

(i) භික්ෂූන් වහන්සේලා සඳහා නිර්මාණය කරන ලද ඝර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- උපෝසථඝර
- පධානඝර
- ජන්තාඝර

උදාහරණ වලට එකතු දෙන්නේ නැත.

(ii) තිල්ලක්ගම බෝධිඝරය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05 යි)

තිල්ලක්ගම බෝධිඝරය

- අනුරාධපුර යුගයේ ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨත්වය ගෙන හැර දක්වන මෙම බෝධිඝරය ක්‍රි.ව 08, 09 සියවස් වලට අයත් යැයි සැලකේ.
- ශ්‍රී ලංකාවේ මේ වන විට මනා සංරක්ෂණයකින් සමන්විත මෙම බෝධිඝරය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රදේශයේ දළදාගමට ආසන්නව පිහිටා ඇත.
- මෙම බෝධිඝරය චතුරස්‍රාකාර වූ මාලක දෙකකින් සමන්විත වන අතර, එය පහල මාලකය හා උඩු මාලකය යනුවෙනි.
- සම්පූර්ණයෙන්ම කළුගල් මාධ්‍යයෙන්ම ගොඩ නගා ඇති ව්‍යුහාත්මක ගොඩනැගිල්ලක අවශේෂ දක්නට ලැබේ. මෙමගින් එකල සිටි ගල්වඩුවාගේ ප්‍රතිභාව මැනවින් කියාපායි.
- පහල මාලකය පැත්තක් අඩි 34 ක් පමණ වන අයුරින් සමචතුරස්‍රාකාර හැඩයක් ගනු ලබන අතර ඒ වටා ගල් පුවරු අලවා ඇත්තේ බැතිමතුන් සඳහා ප්‍රදක්ෂිණාපතයක් ලෙසින් භාවිතයට ගැනීම සඳහාය.
- මෙයට පිවිසීම සඳහා නැගෙනහිර හා බටහිර දිශාගතව දොරටු දෙකක් යොදා ඇත.
- උඩුමාලකය, පහල මාලකය මධ්‍යයේ නිර්මාණය කර ඇති අතර එහි පැත්තක දිග අඩි 13 ක් පමණ වේ. මෙයද සමචතුරස්‍රාකාර වේදිකාවක් වේ. බෝධිවෘක්ෂය මෙහි රෝපණය කර තිබෙන්නට ඇත.
- උඩුමාලකයේ බිත්ති සතර දිශාවට දිස්වන අයුරින් කළුගලින් නිර්මාණය වූ පූජාසන හෙවත් මල් ආසන හතරක අවශේෂ දැක ගත හැකිය.
- දෙවන මළුව නොහොත් උඩු මාලකය ගල් බිත්ති මත සිංහ රූප කැටයමෙන් යුත් ගල්පුවරු ඉතා කලාත්මකය.
- මෙම බෝධිඝරයේ ඇති කැටයම් අනුරාධපුර යුගයේ අග භාගයේ දැකිය හැකි කලා ලක්ෂණවලින් සමන්විතය.
- පහල මාලකයේ ගල් බැම්ම තුළ පාදම වටා ඉදිරි පෙනුම පමණක් දැක ගත හැකි කැටයම් කරන ලද ඇත් රූප 105 කින් සමන්විත පීඨිකාවකි. මෙකී ලක්ෂණය පැරණි අනුරාධපුර වාස්තු විද්‍යාත්මක ලක්ෂණ කියාපායි.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- නැගෙනහිර දොරටුවේ ඇති ප්‍රධාන ගල් උළුවස්සෙහි ඉතා අලංකාර කැටයමෙන් යුත් නාග මානවකයෙකුගේ පිළිරුව, ලියවැල් වැනි ගිනිසිළු රටා, නළාවක් පිඹින ගණ රූපය සහ අශ්වයෙකු පිට නැගී සිටින කුඩා වාමනයකුගේ රූ ඉතා සුවිශේසි කැටයම් වේ.
- ගොඩනැගිල්ලට පිවිසෙන ස්ථානයෙහි කැටයමෙන් තොර සඳකඩ පහණක් වන අතර පියගැටපෙළ දෙපස ඇති කුඩා ප්‍රමාණයේ කොරවක්ගල්වල දොරටුපාල රූප මෙන්ම මකර රූප කැටයම් කර තිබීම සුවිශේෂී වේ.
- පහල මාලකයේ පාදමේ පිටපැත්තේ සහ ඉහල මාලකයේ පාද වටා ලියවැල් හා හංස රූප පේළි සහිත කැටයම් වේ.
- අඩි 07 ක් පමණ උසැති ප්‍රකාර බැම්ම සහ සම්බන්ධ ගල් කණු 16 ක් පමණ වේ. එම ගල් කණු මත දැවමය පියස්සක් තිබෙන්නට ඇත. වහල ඉදිකරන්නට ඇත්තේ ප්‍රදක්ෂිණා පථය ආවරණය වන පරිද්දෙනි.

(iii) **අනුරාධපුර ඉදිවූ කුට්ටම් පොකුණ සහ පොළොන්නරුවේ ඉදිවූ නෙළුම් පොකුණ අගනා ශෛලමය නිර්මාණයන් ය. ආකෘතිය හා ශිල්පීය කුසලතාව පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.** **(ලකුණු 08)**

අනුරාධපුරයේ අභයගිරි විහාර සංකීර්ණයට අයත් කුට්ටම් පොකුණ හා පොළොන්නරු යුගයේ ජේතවනාරාම (තිවංක පිළිමය) විහාර භූමියේ භූමි පරිශ්‍රයට අයත් නෙළුම් පොකුණ ශ්‍රීලාංකේය වාරි හා ගෘහ නිර්මාණ ශිල්පයේ විශිෂ්ඨත්වය ගෙන හැර දක්වන මනස්කාන්ත පොකුණු දෙකකි.

- කුට්ටම් පොකුණ නිර්මාණය වූයේ අභයගිරි විහාරවාසි භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය පිණිස වන අතර, ~~කුට්ටම් පොකුණ~~ නෙළුම් පොකුණ නිර්මාණය වී ඇත්තේ පොළොන්නරු යුගයේ රජවරුන්ගේ ඇති කලාත්මක චින්තනයන් මත ගොඩ නැගුනු සංකල්ප ලොව කියාපාන්නන් ලෙසිනි.
- භික්ෂූන් වහන්සේලාට ස්නානය පිණිස ඉදිවූ කුට්ටම් පොකුණ කුඩා සහ විශාල වශයෙන් පොකුණු ද්විත්වයක් වන අතර පොළොන්නරු නෙළුම් පොකුණ තනි නිර්මාණයකි.

**කුට්ටම් පොකුණෙහි ආකෘතිය**

- මෙය සෘජුකෝණාස්‍රාකාර දිගැටි හැඩැති පොකුණු දෙකකින් සමන්විත වන අතර ඉතා සරල වූවකි.
- කුඩා පොකුණ උතුරු දිශාගතවත්, විශාල පොකුණ දකුණු දිශාගතවත් පිහිටනසේ නිර්මාණය කර ඇත.
- කුඩා පොකුණෙහි දිග අඩි 91 ක් හා පළල අඩි 51 ක් වන අතර ගැඹුර අඩි 14 කි.
- විශාල පොකුණේ දිග අඩි 132 ක් හා පළල අඩි 51 ක් වන අතර ගැඹුර අඩි 18 කි.
- පොකුණු දෙකම මනා අකෘතිමය සැලැස්මකට නිර්මාණය කර ඇත.
- පොකුණු දෙකම කළු ගල් භාවිතයෙන් නිර්මාණය කරන ලද ඉතා පටු ඇල මාර්ගයක් බඳු බැම්මකින් සම්බන්ධ වීම තුළින් පොකුණු යුගලක ආකෘතිමය නිර්මාණයක් ලෙස දැකිය හැකිය.

**නෙළුම් පොකුණෙහි ආකෘතිය**

- මෙය පිපුණු නෙළුමක හැඩය අනුව නිමවා ඇත.
- වෘත්තාකාර හැඩයක් කළු ගල් පුවරු භාවිතයෙන් නෙළුම් පෙති 08 ක් වටේට දිස්වන අයුරින් දැකිය හැකිය.
- ඉහල සිට පහල බැසීමේදී ක්‍රමාණුකූලව කුඩා වන ලෙසින් තට්ටු 05 ක් දැකිය හැකි ලෙස ආකෘතිමය වටිනාකමක් දීමට එකල ශිල්පියා ගත් උත්සාහය අගයකොට සැලකිය යුතුය.
- මෙම හැඩය නිර්මාණය කර ඇත්තේ පොකුණෙහි විශ්කම්භය අඩි 24 ක් පමණ කුඩා බිම් ප්‍රමාණයකිනි. දළ වශයෙන් ගැඹුර අඩි 05 ක් පමණ වේ.
- සමස්ථයක් වශයෙන් මේ ආකෘතිය නිර්මාණය කර ඇත්තේ නෙළුම් මලක බාහිරින් ඇති විශාල පෙතිවල සිට මැද ඇති කුඩා පෙති දක්වා දැක ගත හැකි නෙළුම් පෙති 08 කට වෘත්තාකාර කොටස බෙදන ලෙසිනි.

**අනුරාධපුර කුට්ටම් පොකුණෙහි ශිල්පීය කුසලතා**

- මෙහි වඩාත් කැපිපෙනෙන ශිල්පීය කුසලතාවය වනුයේ එහි දක්නට ඇති ඉතා දියුණු ජල කළමනාකරණයයි.
- පොකුණට ජලය සපයාගෙන ඇත්තේ එයට නුදුරින් ඇති අභය වැවෙන් විය හැකිය. භූගත ජල මාර්ගයක් ඔස්සේ ජලය සම්පාදනය කර ගැනීමට එකල වාස්තු වාරි ශිල්පියා සමත් වීම කැපී පෙනේ.
- පොකුණට ජලය ලැබීමට ප්‍රථම ශෛලමය වූ විශේෂ පෙරහන් කුටිරයටකට ජලය සැපයීමක් කර ඇති මෙහි ගල් කැට වැලි අතරින් ගොස් ජලය පිරිසිදු පෙරහන් කිරීමක් සිදුවන ලෙසින් ඉතා උසස් ජල පිරිපහදු තාක්ෂණයක් එකල ශිල්පියා තුළ තිබී ඇත.
- එසේ පිරිසිදු වූ ජලය කුඩා පොකුණකට ප්‍රවිශ්ඨ වන්නේ ඉතා කලාත්මක සිංහ රූපයක් කැටයම් කළ ගල් විවරයකිනි. මෙමගින් තාක්ෂණය මෙන්ම කලාත්මක ශිල්පීය කුසලතාවක් දැක්වීම අගයකොට සැලකිය හැකිය.
- කුඩා පොකුණ විශාල පොකුණට වඩා තරමක් උසින් නිර්මාණය කර තිබීමත් පිරිසිදු වූ ජලය මුලින්ම කුඩා පොකුණට වැටී ඉන් පසු විශාල පොකුණට ගලා යන ලෙසින් නිර්මාණය කර තිබීම ද තවත් ශිල්පීය කුසලතාවකි.
- එසේම භාවිතයෙන් පසු අපවිත්‍ර ජලය භූගත ජල මාර්ගයකින් නැවත පොකුණෙන් පිටතට යැවීමටත් පතුලේ ඇති ඉතිරි ජලය පිරිසිදු කිරීම සඳහා සුවිශේෂී තාක්ෂණිකමය වටිනාකමින් යුත් දොරටු අභ්‍යන්තරයේ නිර්මාණය කර තිබීමත් තවත් ශිල්පීය කුසලතාවයකි.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- එසේම පොකුණේ බිත්ති සහ පියගැට පෙළ නිර්මාණය ද කපා ඔප දැමූ ගල් පුවරු භාවිතය ද මෙකී ගල්පුවරු කිසිදු බදාමයකින් තොරව එකිනෙකට හිරවනසේ නිවැරදිව කපා ඔප මට්ටම් කර තිබීම එකල ගල් වඩුවාගේ සුවිශේෂිත්වය පිළිබිඹු කරයි. (මිසර පිරමීඩ නිර්මාණයේදී ද මෙම තාක්ෂණික ක්‍රමය භාවිත කර ඇත.)

- පොකුණට බැසිමේදී සතර පැත්තෙහිම පියගැටපෙල තුළ ගල් සම්බන්ධ කර ඇත්තේ ද නිවැරදි ජ්‍යාමිතික ශිල්ප ක්‍රමයටය.

- එසේම පිය ගැටපෙල දෙපස ඇති පුන්කලස් මෙන් ම කුඩා පොකුණෙහි දක්නා ඇති පෙණ 05 කින් සමන්විත නාග රූපය ද විශිෂ්ඨ ශිල්පිය කුසලතා දක්වන නිර්මාණයන් ය.

**පොළොන්නරු නෙළුම් පොකුණෙහි ශිල්පිය කුසලතා**

- පොළොන්නරු ශිල්පියා සතුව තිබූ ජ්‍යාමිතික ඥාණයේ පරිනත බව පෙන්නුම් කිරීමට කදිම නිදසුනක් ලෙස මෙය හැඳින්විය හැක.
- කළුගල් වැනි දැඩි පාෂාණයකින් නෙළුම් පෙතිවල දැක ගත හැකි ස්වාභාවික වක්‍රය අනුව ඔප දැමූ කළුගල් භාවිතය සුවිශේෂි ශිල්පිය කුසලතාවයකි.
- මෙහි ඇති සියලුම පෙති වළල්ලක්ම, ජ්‍යාමිතික කෝණයකින් නිවැරදිව කපා ගැනීමෙන් එකිනෙක මත සිටින සේ සවි කිරීම ද ශිල්පිය කුසලතාවයක් ලෙස දැක්විය හැකිය.
- මෙහිදී ද මෙම ගල් පුවරු අතර කිසිදු බදාමයක් හෝ කිසිදු බන්ධකයක් භාවිත නොකිරීමට තවත් ශිල්පීය කුසලතාවයක් ලෙසින් පෙන්වා දිය හැකිය. (මෙය ද කලින් කළ පරිදි කුට්ටම් පොකුණ මිසර පිරමීඩ ඉදි කිරිම තුළ තිබූ තාක්ෂණමය භාවිතය)
- නෙලුම් පොකුණෙහි ජල සැපයුම් ක්‍රමවේදය කුට්ටම් පොකුණෙහි තරම් ඉතා සංකීර්ණ ක්‍රමවේදයක් නොවීය.
- පොකුණට ජලය ලබා ගෙන ඇත්තේ අසල ඇති ඇළ මාර්ගයකින් හෝ ජලාශයකිනි. පරිහරණය කළ ජලය බැහැර කිරීමට භූගත ජල නල මාර්ග තිබීම එකල ශිල්පීය කුසලතාවයක් දැක්වීමකි.
- නෙලුම් පොකුණ විහාරයක අලංකරණ අංගයක් ලෙසිනුත් සෞන්දර්යාත්මක වටිනාකමකින් දැක ගත හැකි අයුරින් එකල, ගල් වඩුවාගේ තිබූ කලා නෛපුණ්‍යත්වය හා ශිල්පිය කුසලතාවය පෙන්නුම් කරන අගනා නිර්මාණයක් ලෙසින් නෙලුම් පොකුණ පෙන්වා දිය හැකි අතර, වර්තමානයේ ශ්‍රී ලාංකේය රඟහලක් සඳහා ද (නෙළුම් පොකුණ) මෙහි ආකෘතිය හා ශිල්පීය කුසලතාවයන්ගේ හැඩය ගෙන ඇත.

2. ශ්‍රී ලංකාවේ ආගමික සිතුවම් නිර්මාණකරණයේ නියැලුණු චිත්‍ර ශිල්පීහු විවිධ තේමා යටතේ විශිෂ්ට නිර්මාණ බිහි කළෝ ය.

(i) නාරායන ස්වාමි ශිල්පියා විසින් වැල්වැටිතුරෙයි මුත්තු අම්මාන් කෝවිලෙහි ඇඳ ඇති සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

- සූර සම්හාරම් සිතුවම
- අසංකාසූර සම්හාරම් සිතුවම
- විනයාගර් පුරාණය
- වැල්වැටිතුරෙයි මුත්තුඅම්මාන් කෝවිලට අදාළ ඉතිහාසයේ කොටස් 04 කට අදාළ සිතුවම්

(ii) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා විසින් සිතුවම් කරන ලද මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ දක්නට ලැබෙන 'යහපත් සමරිතානුවා' සිතුවම පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

ක්‍රි.ව. 1900 - 1975 කාල පරාසය තුළ බටහිර කලා ආකෘතියක් පදනම් කරගෙන ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් ඇති කරලීමට ප්‍රරෝගාමී වූ ශිල්පියෙකු ලෙස ඩේවිඩ් ෂිලින්ෆෝර්ඩ් පේන්ටර් හඳුන්වා දිය හැකිය.

- මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ දෙව් මැදුරේ ඇතුලු බිත්තියේ ඇඳ ඇති යහපත් සමරිතානුවන්ගේ උපමාව ඇතුලත් බිතුසිතුවම බයිබලයේ සඳහන් වූවකි.
- මෙයින් නිරූපණය වන්නේ පහරදීමකට ලක් වී තුවාල ලද පුද්ගලයෙකුට යහපත් සමරිතානුවරයා පිහිටවන ආකාරයකි.
- මොහු විසින් ඇඳි මෙම සිතුවම දුර්වර්ණ වූ නිසා ක්‍රි.ව 1957 දී නැවත පින්තාරු කරන ලද්දේ ද පේන්ටර් ශිල්පියා විසිනි.
- ඩේවිඩ් පේන්ටර් මෙකී බයිබල් කථාව හා සම්බන්ධ වටපිටාව ශ්‍රී ලංකේය පරිසරයක් මවා පැවේය. සිතුවමෙහි පසුබිමෙහි යෙදීමෙන් ශ්‍රී ලාංකේය ගැමි පරිසරයක් ගෙන ඒමට උත්සාහ ගෙන ඇත.
- තලය මත රූප සංරචනයේදී පෙරබිම මැදබිම හා පසුබිම, වශයෙන් ගොඩ නගා ඇත.
- තල කිහිපයකින් සමන්විත මෙම සිතුවමෙහි ගැඹුර හා පර්යාවලෝක ලක්ෂණයන් මනාවට පෙන්නුම් කර ඇත.
- යුරෝපීය ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාවේ ආභාසය ලබා ඇත.
- මෙහි රූප සංරචනය තුළදී ප්‍රධාන චරිතය වන යහපත් සමරිතානුවා මෙන්ම තුවාල ලැබූ තැනැත්තා පෙරබිමෙහි ඇඳ ඇති අතර, භූමි දර්ශනය හා සෙසු චරිත චිත්‍රයට ගැලපෙන අයුරින් මැදබිම හා පසුබිම නිර්මාණය කර ඇත්තේ ශ්‍රී ලාංකේය පරිසරයක් ගෙන හැර දක්වමින් වීම සුවිශේෂී කරුණකි.
- නිරුවත් හා අඩනිරුවත් රූප සංරචනය ඩේවිඩ් පේන්ටර් ග්‍රීක මූර්ති කලා අභාෂය ඇසුරු කර ගනිමින් කළ අතර, මෙහිදී ද මිනිස් රූප නිරූපණය තුළදී පහර කෑමට ලක්වූ මිනිසාගේ අඩ නිරුවත් රූපය ඔහුගේ ශිල්පීය අනන්‍යතාවය කියාපානු ලබයි.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ඩේවිඩ් පේන්ටර් යුරෝපයේ රාජකීය කලා ඇකඩමිය තුළ කලා අධ්‍යාපනය හැදෑරූ අය බැවින් ඔහුගේ සිතුවම් අතර එන යහපත් සමරිතානුවා නම් චිත්‍රය තුළ ද නූතනවාදී ගුණාංග මෙන්ම ආලෝකය සහ සෙවනැලි සමබරව යොදා ගනිමින් මිනිස් රූපවල ස්වභාවිකත්වය ඉස්මතු කිරීමට උත්සාහ ගෙන ඇත.
- මෙම චිත්‍ර ගල් බිත්තියක් මත බදාම ගා ඒ මත ඇඳ තිබීම ද ආසියාතික කිතුනු කාලයේ සුවිශේෂී හැරවුම් ලක්ෂයක ප්‍රතිඵයක් ලෙස පෙන්වා දිය හැකිය.
- මෙම යහපත් සමරිතානුවරයා සිතුවම මගින් ආගමික පණිවිඩයක් දේශීය ජනතාවට තුළ සමීපවන අයුරින් අර්ථවත්ව ක්‍රිත්ව විද්‍යාලයීය දෙව් මැදුරේ නිර්මාණ කර ඇත්තේ ශ්‍රී ලංකාවේ සිතුවම්කරණයේ වැදගත් වූ සංසිද්ධියක් සනිටුහන් කරමිනි.

**(iii)** 'මාර පරාජය' බෞද්ධාගමික චිත්‍ර ශිල්පීන් විසින් විවිධාකාරයෙන් සිතුවමට නගා ඇත. බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් ඇඳි ජෝර්ජ් කීට් ශිල්පියා හා බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් ඇඳි සෝමබන්දු විද්‍යාපති ශිල්පියා 'මාර පරාජය' සිතුවම් කළ ආකාරය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 0

- ශ්‍රී ලාංකේය නූතන බෞද්ධ සිතුවම් කලාවේ විශිෂ්ටතම සිතුවම් හමුවන ස්ථාන 02 ලෙ බොරැල්ලේ ගෝතමී විහාරයත් බෙල්ලන්විල රජමහා විහාරයත් පෙන්වා දිය හැකි අතර, එහි හමු වන ''මාර පරාජය'' සිතුවම් සුවිශේෂී වේ.
- ජෝර්ජ් කීට් ශිල්පියාගේ කලා ශෛලිය ගෝතමී විහාරයේ මාරාපරාජය සිතුවම තුළ දක් ලැබෙන්නේ ඝණිකවාදී සහ රේඛිය නූතන වාදයත්, ජෝර්ජ් බ්‍රාක් හා පිකාසෝ වැනි ශිල්පින්ගෙන් ලැබු නූතන බටහිර කලා අභාසය දේශිය බෞද්ධ තේමාවක් තුළට ඇතුළ කිරීමක් ය.
- සෝමබන්දු විද්‍යාපති ශිල්පියාගේ කලා ශෛලිය බෙල්ලන්විල රජමහා විහාරයේ මාර පරාජය සිතුවම සාම්ප්‍රදායික බෞද්ධ සිතුවම් සම්ප්‍රදාය, අජන්තා සහ මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදායේ ආභාසයත් නූතනත්වයට ගෙන ඒමකි.
- බොරැල්ලේ ගෝතමී විහාරයේ මාරයින් දැක්වීමේදී ජ්‍යාමිතික හැඩතල සහ වක්‍ර රේඛා මගින් හැඟීම් සහ ක්‍රියාවන් සංකේතාත්මකව ඉදිරිපත් කරයි.
- බෙල්ලන්විල රජ මහා විහාරයේ මාරසේනාව දැක්වීමේදී රූප යථාර්ථවාදි ලෙස නිරූප කිරීමත්, මාරයින් තුළට ක්ලේශයන් වැනි මානුෂිය හැඟීම් මෙන්ම අකුසල ධර්මයන් ඇතුළත් කිරීමත්, එකී කෙළෙස් පරාජය කිරීමත්, දස මරුන් පැරද වීම සංකේතාත්මකව පිළිබිඹු කරයි. බෞද්ධ සාහිත්‍ය කතාව හා බැඳුණු සාම්ප්‍රදායික විශ්වාසයන් පිළිගැනීම ශ සිතුවමින් නිරූපණය වේ.
- ජෝර්ජ් කීට් විසින් ඇදී මාරපරාජය සිතුවමේ වර්ණ භාවිතයේදී තද පැතලි ප්‍රාථමික වර් භාවිත කරයි. කහ, රතු, නිල් වැනි වර්ණවලට ප්‍රමුඛත්වය දෙමින් සුදු. කොළ, නිල්, කළ වැනි වර්ණ භාවිතයට ගෙන දීප්තිමත් වර්ණ පදාස ක්‍රමයට වර්ණ ගන්වා ඇත.
- බෙල්ලන්විල රජමහා විහාරය මාරපරාජය සිතුවමෙහි ස්වාභාවික හා සාම්ප්‍රදායික විහාර බිතු සිතුවම්වලට අදාළ දීප්තිමත් වර්ණ භාවිතයක් දක්නට ඇත.

- ගෝතමී විහාරයේ බුද්ධ රූපය ඉදිරි පසින් විශාල රේඛාමය හැඩයක් පෙන්නුම් කරන අතර, බුදුන් වහන්සේගේ සන්සුන් බව මෙන් ම භාවනා යෝගී බව පෙන්වයි.
- බෙල්ලන්විල රජ මහා විහාරයේ බුද්ධ රූපය තුළින් ප්‍රතාපවත් බවක් පෙන්නුම් කරන අතර, ඉතා සංයමයෙන් වීරාසන ඉරියව්වෙන් සමාධිගතව සිතුවම මධ්‍යයේ නිරූපනය කෙරේ.
- ගෝතමී විහාරයේ මාර පරාජය සිතුවමෙන් ස්වභාවිකත්වයට වඩා භාව ප්‍රකාශනයට මූලිකත්වයක් දී ඇත.
- බෙල්ලන්විල විහාරයේ මානව රූප හැඩ ගැන්වීමේ දී ශිල්පියා විසින් මුද්‍රා නාට්‍ය කලාවේ රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී ලත් ආභාසය චිත්‍ර තුළට එක් කොට ඇත.
- මහනුවර සාම්ප්‍රදායික සිතුවම් ශෛලිය මාරයින් නිරූපණය, මාරායුධ නිරූපණය, මුඛයෙන් පිට වන සර්පයන්, භයංකර මුහුණු ආභාසය කොට ගෝතමී විහාර මාර පරාජ සිතුවම නිර්මාණය කර ඇත.
- බෙල්ලන්විල රජමහා විහාරයේ මිනිස් රූපත් කෙලෙස් සංකල්පයට අනුව ගොඩ නගා ඇත. ආලිංගන ඉරියව් දැක්වෙන චිත්‍ර, ප්‍රාණඝාතය කරන්නන්ගේ රුව, රන් භාණ්ඩ පොදි බැඳගත් මිනිසුන්ගේ රුව උදාහරණ වේ. මෙහිදි මාරයින් යනු බියකරු කොට්ඨාශයක් නොවන බවත් කෙලෙස් බරිත් යුතු මානව ස්වරූපයෙන් මාරයින් ලෙස සිතුවම් කර ඇත.
- ගෝතමී විහාරය මාර පරාජය ඇතුළත් සිතුවම් ඇදි ශෛලිය අඛණ්ඩ කථන මාධ්‍ය වේ. එය චිත්‍රාවලියක එක් අවස්ථාවකි.
- බෙල්ලන්විල රජ මහා විහාරයේ සිතුවම් බිත්තියේ තලය පුරා පදාස ක්‍රමයට නාට්‍යානුසාරයෙන් දක්වා ඇත.

3. පොළොන්නරු යුගයේ දී හින්දු ආගමික සංකල්ප මත පදනම්ව ආගමික මූර්ති ගණනාවක් දේවාල ආශ්‍රිතව නිර්මාණය කර ඇත.

(i) හින්දු ආගමික මූර්ති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

- නෙළීම
- ඇඹීම
- කැටයම් කිරීම
- වාත්තු කිරීම (ඝණ හා කුහර)

(ii) ශිව සෝමස්කන්ධ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

- හින්දු දහමෙහි විශේෂයෙන්ම චෝල හා පල්ලව සමයේ දී වඩාත් ජනප්‍රිය වූ ශිව දෙවියන් හා සම්බන්ධ සුවිශේෂී වූ මූර්තියක් හෝ සමූහ මූර්තියක් ලෙසින් ශිව සෝමස්කන්ධ මූර්තිය හඳුන්වා දිය හැකිය. ශිව දේවාල අංක 05 හමු වී ඇත. (12 සියවස)
- ශිව සෝමස්කන්ධ යන නාමය උත්පාදනය වී ඇත්තේ ප්‍රධාන වචන තුනක ගැලපීමෙනි 'සෝ' යන්නෙන් (ශිවගේ භාර්යාව උමා දෙවියන්) 'ස්කන්ධ' හෙවත් කාර්තිකේය දෙවියන්/ මුරුගන් (ශිවගේ සහ උමාගේ පුත්‍රයා)
- ඒ අනුව සෝමස්කන්ධ යනු ශිව දෙවියන් එකට සිටින අකාරය හෙවත් ශිව දෙවින්ගේ පවුලේ ස්වරූපය පෙන්නුම් කිරීමකි.
- මෙම මූර්තිය තිරස් අතට සෘජුකෝණාස්‍රාකාර පීඨිකාවක දැකිය හැකිය.


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- ප්‍රධාන චරිත වන ශිව දෙවියන් සාමාන්‍යයෙන් වම්පස වාඩි වී සිටියි. ශිව ආශිර්වාදාත්මක ඉරියව්වලින් යුක්ත වන අතර ඔහුගේ හිස ජටා මකුටය, (කේතුකකාර හිස් පළඳනාව) අඩ සඳ ලකුණ ද අත් සතරක් ද දැක ගත හැකිය.
- ඉහළ දකුණු අතෙහි කෙටේරියක් ද, ඉහළ වම් අතෙහි මුවෙකුගේ රූපයක් ද, පහළ දකුණු අතින් අභය මුද්‍රාව ද, පහළ වම් අතින් වරද මුද්‍රාව ද වේ.
- ශිව දෙවියන් එක් කකුලක් පහත හෙළා සිටින අතර, අනෙක ආසනය මත නවා ලලිතාස ලීලාවෙන් දක්වා ඇත.
- ශිව දෙවියන්ට ආසන්නව හිඳගෙන සිටින උමා දේවිය මඳක් ඇලව ශිව දෙස බලා සිටින ඉරියව්වකි.
- ශිව හා උමා දේවිය මධ්‍යයෙහි ස්කන්ධ රූව තිබිය යුතුය වර්තමානයේ මෙය දක්නට නැ අතර රඳවා තිබූ කුහරය පමණක් දැකිය හැකිය.
- මෙම සමූහ මූර්තිය ඉහළින් රැස්වලල්ල එසේත් නැතිනම් 'තිරුවාසි' යනුවෙන් හඳුන්වන කොටස තුළින් විචිත්‍රත්වයක් මූර්ති තුළට ගෙන එනු ලබයි.
- මෙම මූර්තිය ඝන වාත්තු ක්‍රමයටත් පාදම කුහර සහිත වාත්තු ක්‍රමයටත් නිර්මාණය කර ඇත.
- කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත.

(iii) හින්දු ආගමික මූර්ති අතර නටරාජා මූර්තිය සුවිශේෂී වේ. එහි සංකේත භාවිතය හා කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08යි)

නටරාජා මූර්තිය යනුවෙන් හඳුන්වන්නේ ශිව දෙවියන්ගේ විශ්වයීය නර්තනය හෙවත් ශිව තාණ්ඩව නර්තනය පිළිබිඹු කෙරෙන සංකේතාත්මක හින්දු කලා නිර්මාණයකි. ක්‍රි.ව 9 - 12 සියවස් අතරට අයත් යැයි සැලකේ. (චෝල යුගය)

- නටරාජා මූර්තිය මගින් විශ්වයේ සදාකාලික චක්‍රය මැවීම, විනාශය, ආරක්ෂා කිරීම විමුක්තිය, මායාව යන ශිවගේ පංචකෘත්‍ය සංකේතවත් කරනු ලබයි.
- චෝල යුගයේ නිර්මිත මෙම මූර්තියෙහි ගිනි වළල්ල හා රශ්මි මාලාවෙන් (තිරුවාසි) විශ්ව චක්‍රය වූ මැවීම හා විනාශය සංකේතවත් කරයි. නටරාජා වටා ඇති ගිනි ජාලාවලින් සමන්විත තිරුවාසි තුළින් විශ්වයේ සදාකාලික චක්‍රය සහ කාලය සංකේතවත් කරන අතර එය විශ්වය නිර්මාණය කරන සහ අවසානයේ විනාශය ද සිදුකරන ආකාරය නියෝජනය කිරීමකි.
- දකුණු ඉහළ අතෙහි ඇති කුඩා බෙරය මගින් ශබ්දය සහ මැවීම සංකේතවත් වන අතර, බෙර හඬින් මැවීමේ මුල්ම ශබ්දය වන "ඕම්" නිකුත් වන බව විශ්වාස කෙරේ. එය කාලය ගෙවියාම මෙන්ම විශ්වය නිර්මාණය සංකේතවත් කරයි.
- වම් උඩු අතේ ගිනි සිළුව මගින් විනාශය හා සංහාරය පිළිබිඹු කරවයි. මෙම ගින්න මගින් පැරණි දේ විනාශ කිරීමත් නව නිර්මාණයන්ට මාර්ගය පාදා දීමත් සංකේතවත් කරන අත විනාශයේ බලය කියා පායි.
- දකුණු අත (පහළට) අභය මුද්‍රාව තුළින් ආරක්ෂාව සහ අභය දීම සංකේතවක් කරයි.

- මෙයින් සංකේතවත් වන්නේ ශිව තම බැතිමතුන් ආරක්ෂා කරන බව හා ඔවුනොවුන්ට ආශිර්වාදය කරන බවත් බිය නොවන්න යන්න සංකේතවත් කිරීමකි.
- පහලට නෙලා ඇති යටි අත පාදය දෙසට යෙදවීම අනුග්‍රාහ හෙවත් ගජහස්ත මුද්‍රාව නිරූපණය වන බව සංකේතවත් කරයි.
- ඔසවා ඇති වම්පාදය මගින් විමුක්තිය පිළිඹිබු කරන අතර එය බැතිමතුන්ට භව චක්‍රයෙන් මිදීමට ඇති මාර්ගය හා ශිවගේ සරණ සංකේතවත් කරයි.
- දකුණු පාදයෙන් පාගා සිටින වාමන රූපය අවිද්‍යාව දුරලීම සංකේතවත් වන අතර, එය පාගා දැමීමෙන් සංකේතවත් වන්නේ ඥාණය හා දැනුම මගින් අඥාණකම පරාජය කිරීමයි.
- දකුණු කනෙහි පුරුෂ කරාබු හා වම් කනේහි ස්ත්‍රී කරාබු තුළින් අර්ධනාරිශ්වර සංකල්පය පෙන්නුම් කරයි.
- හිස කෙස් මගින් ගංගානම ගඟ සංකේතවත් කරන අතර ඒ මගින් පාරිශුද්ධත්වය දක්වන අතර, අඩ සඳ කාලය ද නර්තනයේ දැවැන්ත ශක්තිය ද සංකේතවත් කරයි.

නටරාජා මූර්ති කලා ලක්ෂණ

- ශිව නිරූපණය කර ඇත්තේ තාණ්ඩව නම් වූ ජව සම්පන්න ප්‍රතිමත් වූ ද නර්තන ඉරියව්වකි.
- මූර්තියෙහි දක්නට ලැබෙන චලනය තුළ ඇති රිද්මයානුකූල බව සහ ශරීරයේ සමබරතාවය තුළින් නරඹන්නා තුළ ගතික හැඟිමක් දෙන අයුරින් නිර්මාණ කර තිබීම සුවිශේෂිය.
- වේගවත් නර්තනය සමඟ ශිවගේ මුහුණේ ඇති අවබෝධාත්මක ස්වරූපය තුළින් දෙවියන්ගේ දෙබිඩි පිළිවෙත වූ සන්සුන්කම හා විනාශය මැනවින් නිරූපණය කර ඇත.
- ලෝකඩ භාවිතය තුළින් නිර්මාණය කිරීමේ කුසලතාවය හා දිලිසෙන ස්වභාවය මෙන්ම කල්පවතින සුන්දරත්වයක් ද එක් කිරීම සුවිශේෂී කරුණකි.
- ශිවගේ හිසකේ, කරාබු, මාල, පාද වළලු සහ ගෙලෙහි ඇති සර්පයා විස්තරාත්මක නිරූපණයන්ය. විස්තරාත්මක බව තුළින් සෞන්දර්යාත්මක ගුණය ප්‍රශස්ථ මට්ටමක පැවතීම ඉතා ඉහළය.

**'ආ' කොටස**

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)**

4. ගන්ධාර හා මථුරා ගුරුකුල බෞද්ධාගමික මූර්ති රැසක් ලොවට බිහි කළ කලා මධ්‍යස්ථානයන් ය.

   (i) ගන්ධාර කලා සම්ප්‍රදායේ නිර්මාණය වූ ප්‍රතිමා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- හෝර්ටි මන්දාර් පිළිමය
- බ්‍රෙගම් පිළිමය
- තක්තිබහිර් පිළිමය
- සහරි බහ්ලොල් පිළිමය
- දුෂ්කර ක්‍රියාව පිළිමය


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සඳහා ගන්ධාර කලා සම්ප්‍රදාය ඉවහල් වී ඇති ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 05 යි)

- ක්‍රි.ව 1-5 සියවස අතර කාලයේ ග්‍රීක සම්භවයක් සහිත කුෂාණ පාලකයින්, වයඹ දිග ඉන්දියාව, පකිස්ථානය, ඇෆ්ගනිස්ථානය ආශ්‍රිත ප්‍රදේශ පාලනය කළහ. ගන්ධාර කලාව මෙම ප්‍රදේශය පුරා ව්‍යාප්ත විය.
- කුෂාණ පාලකයින් තම බලය තහවුරු කර ගැනිම සඳහා බුදුදහම වැළඳගෙන, බුදුදහම රාජ්‍ය ආගම බවට පත් කරයි.
- ගන්ධාර බෞද්ධ කලාව ප්‍රභවය ලැබීම සඳහා පාලකයින් සතු ග්‍රීක රෝම සබඳතා, ඉන්දිය ස්වදේශික සංස්කෘතිය හා මහායාන බුදු දහමේ බලපෑම මත සිදු විය.
- මහායාන බුදු දහමේ ඥාණ මාර්ගය වඩා භක්ති මාර්ගය වැදගත් කොට සැලකීම හේතුවෙන් ප්‍රතිමා වන්දනය අත්‍යවශ්‍ය විය.
- කුෂාණ රාජ්‍ය සමය තෙක් බුදුන්ගේ රුව රූපකායෙන් දැක්වීම සිදු නොවිය. ප්‍රතිමා වන්දනාවට හුරුවී සිටින කුෂාණ පාලකයින් ඉන්දිය අදහස්වලට පටහැනිව මාහායාන බෞද්ධ බලපෑම හා බටහිර ග්‍රීක රෝම කලා ආභාසය හේතුවෙන් බුදුන් වහන්සේ රූපකායෙන් දැක්වීමට පෙළඹුනහ.
- කුෂාණ රජවරුන් බටහිර රටවල් සමඟ නිරතුරු සබඳතා පැවැත්වීම හේතු කොට ගෙන ඒ ප්‍රදේශවල කලාකරුවන්ගේ සහයෝගය ලබාගෙන ඇත.
- කණිෂ්ක රාජ්‍ය සමයේදි බුදුරුව සහිත රන්කාසියක් නිකුත් කිරීම, ඊට සාක්ෂියක් මෙන්ම බුදුරුව නිර්මාණය කිරීමේ මූලික අවස්ථාව ලෙස හඳුනාගත හැක.
- ගන්ධාර ශිල්පින් ග්‍රීක රෝම දේව ප්‍රතිමාවල ලක්ෂණ බුද්ධ ප්‍රතිමා නිර්මාණ සඳහා ආදේශ කොට ගෙන ඇත.
    - බුද්ධ ප්‍රතිමාවේ මුහුණ ග්‍රීක ඇපලෝ දෙවියන්ගේ මුහුණ ස්වරූපය ගැනීම
    - චිවරය ග්‍රීක ප්‍රභූ ඇඳුම් හා රෝම වංශාධිපතින්ගේ ටෝගාවට සමාන වීම
    - ඇපලෝ දෙවි රූපය මෙන් විශාල වූත් උෂ්ණීසය හා ස්වභාවික ආකාරයෙන් හිසකෙස් යෙදීම
    - චිවරයේ රැලි ඝනව හා ස්වභාවිකව යෙදීම
    - මදක් විවර වූ දිගු දෙනෙත්, සිහින් දෙතොල් හා ඍජු නාසයෙන් භක්ති රසය ජනනය කරයි.

(iii) මථුරා හා සාරානාත් ගුරුකුලයන්හි නිර්මාණ ගුප්ත යුගයේ දී ඉතා උසස් තත්ත්වයට පත් විය. ඉහත කියමන සනාථ කිරීම සඳහා මථුරා හා සාරානාත් බුදු පිළිමවල ප්‍රශස්ත මූර්තිමය ලක්ෂණ හා භාව ප්‍රකාශන ඇසුරෙන් පහදන්න. (ලකුණු 08 යි)

- ක්‍රි.ව. 320 දි චන්ද්‍රගුප්ත රජුගෙන් ගුප්ත රාජ්‍ය සමය ආරම්භ වේ. ක්‍රි.ව. 4-7 සියවස්වල දියුණු වූ කලා සම්ප්‍රදාය ගුප්ත කලාව ලෙස හැඳින්වේ.
- ගුප්ත යුගයේදි කලා සංස්කෘතික ප්‍රබෝධයට ආගමික හා දේශපාලන හේතු ගණනාවක් මු වූ අතර උසස් තත්ත්වයට පත්වූ කලා මධ්‍යස්ථාන රාශියක් වේ.
- ගුප්ත රාජ්‍ය සමයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණයට ප්‍රමුඛස්ථානයට පත් නගර දෙක ලෙස මථුර හා සාරානාත් කලා මධ්‍යස්ථාන නම් කල හැකිය.

- ගුප්ත කලාව යනු නවතම කලා සම්ප්‍රදායක් නොව මථුරා කලාවේ වර්ධනීය අවස්ථාවක් වේ.
- ගුප්ත යුගයේදී උසස් තත්ත්වයේ ප්‍රතිමා නිර්මාණ දෙකක් ලෙස,
    - මථුරා හිටි පිළිමය(ජමල්පූර් හිටි පිළිමය)
    - සාරානාත් හිඳි බුදු පිළිමය

| මථුරා හිටි පිළිමය | සාරානාත් හිඳි පිළිමය |
|---|---|
| **මූර්තිමය ලක්ෂණ**<br>• රතු වැලි ගලින් නිමවා ඇත.<br>• ඉතා සුන්දර චමත්කාරජනක කඩවසම් දේහ ලක්ෂණවලින් යුක්තය.<br>• ප්‍රභා මණ්ඩලය නිර්මාණයේදී චාම් රුස් වළල්ල ඉතා සියුම් ලෙස නෙළුම් මල්පෙති හා ලියවැල් වලින් විසිතුරු කර ඇත.<br>• දෙවුර වැසෙන සේ යෙදූ චීවරය ඇඟට ඇලුණ ආකාරයට ලාලිත්‍යමය අයුරින් නිර්මාණය කර ඇත. චීවරයට යටින් අඳනය හා අඳන පටිය සියුම්ව මතුකොට ඇත. | **මූර්තිමය ලක්ෂණ**<br>• චූනාර් නැමැති පාෂාණ භාවිතයෙන් නිර්මාණය කර ඇත.<br>• සම්මත මිනුම් ක්‍රම අනුව පරිමාණුකූලව බුදුපිළිමය නිම කර ඇත.<br>• සංකීර්ණ හා විසිතුරු ලෙස ධම්මචක්ක මුද්‍රාව නිරූපණය කරයි.<br>• පිළිමය පිටුපසින් සිංහ රූප දෙකක්ද මකර මුඛ දෙකක් හා ලියවැල් වලින් විසිතුරු කර ඇත.<br>• වැඩ සිටින ආසනය මැද ධර්මචක්‍ර සංකේතය දක්වා ඇති අතර එහි දෙපස ශ්‍රමණ රූප තුන බැගින් හයක් කැටයම් කර ඇත. දෙපස මුවන් දෙදෙනෙකි.<br>• දෙවුර වැසෙන සේ චීවරය රැළි රහිතව ඇඟට ඇලුණ අයුරින් නිර්මාණය කර ඇත.<br>• පද්මාසන ක්‍රමයෙන් වැඩ සිටින ලෙස නිමවූ විශිෂ්ඨ ප්‍රතිමාවකි. |
| **භාවමය ලක්ෂණ**<br>• අඩවන් දෙනෙත්, මද සිනහව, ලඹ සවන්, උෂ්නීෂය සහිත කුන්ඩලාකාර කෙස්, ඕවලාකාර මුහුණින් බුදුන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ මතු කෙරේ.<br>• නෙළුම් පෙතිවන් අඩවන් දෙනෙත් පහළට යොමුවීම ආධ්‍යාත්මික ගුණය තීව්‍ර කිරීමට සමත් වේ. | **භාවමය ලක්ෂණ**<br>• අඩවන් දෙනෙත්, දෙදුණුවන් ඇහිබැම, අඹළුලවන් පිරිපුන් දෙතොල්, ලඹ සවන් ආදියෙන් යුත් අණ්ඩාකාර මුහුණින් ප්‍රසන්න කරුණාබර බවක් නිරූපණය කරයි. |


අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**5.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු ජන කොටස්සයක් විසූ පෞරාණික ජනාවාසයකි.

(i) ඉන්දු නිම්න වැසියෝ කලා කෘති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- ඇඹීමේ ශිල්පක්‍රමය
- තෙළිමේ ශිල්පක්‍රමය
- වාත්තු කිරීමේ ශිල්පක්‍රමය

(ii) ඉන්දු නිම්න වැසියෝ මානව රුව සියුම්ව අධ්‍යයනය කොට නිර්මාණය කිරීමට දක්ෂතා ඇත්තෝ වූහ. **එක්** උදාහරණයක් ගෙන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

- ඉන්දුනිම්න ශිෂ්ටාචාරය විවිධ මානව වර්ගවලින් සමන්විත වූ බව. විවිධ ශිල්පක්‍රම භාවිතයෙන් නිර්මිත නිර්මාණ ඇසුරෙන් හඳුනාගත හැකිය.
- ඇදහිලි හා විශ්වාස පිළිඹිබුකරන හමු වූ නිර්මාණ අතර
  - රතු වැලිගලින් කළ කවන්ධ රුව
  - අලු වැලිගලින් කළ නර්තන විලාසය පෙන්වන කවන්ධ රුව
  - ලෝහ මාධ්‍යයෙන් නිර්මිත නළඟන රුව
  - සුදු හුණු ගලින් කළ පූජක රුව - සුවිශේෂී වේ.
- මව් දේවතා මැටිරූ
- පෞරාණික [illegible] රූප. (විද්‍යාගත්)

**මානව රුව නිර්මාණය කිරීමේ පොදු ලක්ෂණ**

- ග්‍රීක රෝම නිර්මාණවල ආභාසය සහිතව මානව දේහයේ ස්වභාවිකත්වය, සුන්දරත්වය ඉතා සියුම්ව දැක්වීම
- මාධ්‍යයට අදාළව විවිධ වයනීය ලක්ෂණ සහිතව, පිරිපුන් මස්පිඩුවල ස්වභාවය, පිම්බුණු උදරය වැනි ශරීරාංග මටසිලිටු ලෙස නිර්මාණය කිරීම.
- මානව රුවේ රිද්මය සහ සමබරතාවය දැක්වීම
- නාරි දේහයේ ලාලිත්‍යය, සිහින් අගපසඟ සහ ඉරියව් නිරූපණය
- චරිතයට අදාළව මුහුණින් විවිධ භාව ප්‍රකාශනයන් නිරූපණය කිරීම. (ප්‍රකෝපකාරී බව, ඍජු බව, භාවනානුයෝගී බව)
- ආභරණ සහ ඇඳුම් පැළඳුම් භාවිතයෙන් චරිතයේ අනන්‍යතාවය නිරූපණය කිරීම.
- මාතෘත්වය හා ස්ත්‍රීත්වය නිරූපණය කිරීම

****ඉහත මානව රුවේ පොදු කලා ලක්ෂණ අපේක්ෂකයා විසින් තෝරාගන්නා ලද කෘතියට අදාළව ගලපා ගත යුතුය.***

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ඉතා දියුණු ගෘහ නිර්මාණ තාක්ෂණයක් පැවති බවට සාක්ෂි හමුවී ඇත. ඉහත කියමන ඔවුන්ගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08 යි)

උදාහරණ (ඉතා) නාගරික සැලසුම් බැලිය යුතුය.

ක්‍රි.පූ. 2150 - 1750 අතර කාලය ඉන්දුනිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු නාගරික සැලසුම්කරණ සහ ගෘහ නිර්මාණ ශිල්පීය තාක්ෂණයක් දැක ගත හැකිය.

<u>නගර නිර්මාණය</u>

- මොහෙන්ජොදාරෝ සහ හරප්පා පාලක මධ්‍යස්ථාන හා ජනවාස ලෙස ද කාලිබංගන් කාර්මික නගරය ලෙස ද ලෝතාල් වෙළෙඳ නගරය ලෙස ද හඳුනාගෙන ඇත.

<u>නිවාස නිර්මාණය</u>

- මොහෙන්ජොදාරෝ සහ හරප්පා නගර ඇතුළුපුරය හා පිටතපුරය ලෙස ප්‍රාකාර බැඳ වෙන් කොට තිබුනි.
- රාජ්‍යයේ පොදු ගොඩනැගිලි හා ප්‍රභූ නිවාස ඇතුලු නගරය තුළද (පවුරු, මුර කුටි) පිටත නගරය තුළ සාමාන්‍ය ජනයාගේ නිවාස ද විය.
- ප්‍රභූ නිවාස විශාලව නිර්මාණය කර ඇති අතර, එම නිවෙස් නාන කාමර, වැසිකිළි, කැසිකිළි මෙන්ම මහල් නිවාසයන්ගෙන් ද සමන්විත වේ.
- සාමාන්‍ය ජනයාගේ නිවාස පොදු සැලස්මකට අනුව නිවාස පේළි ලෙස මාර්ග දෙපස දක්වා ඇත.
- සෑම නිවසක්ම ආලින්දය කාමරය හා මුළුතැන්ගෙයකින් යුක්තය.
- නිවාස පේළියකට නිවාස 12 ක් පමණ ඇතුළත් වේ.

<u>සනීපාරක්ෂාව</u>

- මෙම නිවෙස්වල දොරටු හා ජනෙල් ප්‍රධාන මාර්ගයට විවෘත නොවූ අතර අතුරු මාර්ග දෙසට හෝ අංගනය දෙසට විවෘත විය.
- නිවාස පේළියකට පොදු ළිඳක් හා වැසිකිළියක් ඇත.
- ඇතුලත බිත්ති මැටි බදාම ගා ඇත.
- අපවිත්‍ර ජලය මැටි නළ මගින් අතුරු මාර්ගවල කාණු පද්ධතියටත් පසුව ඒවා ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතියටත් යොමු කර ඇති අතර ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන තැන පෙරනයක් දක්වා ඇත.

<u>වෙනත් ගොඩනැගිලි</u>

- ඇතුලු නගරය මධ්‍යයේ අඩි 39 ක් දිග අඩි 23 ක් පලල අඩි 08 ක් පමණ ගැඹුරු ජල තටාකයක් ඇත.
- ජල තටාකය වටා කාමර පේළි ඇති අතර, ආගමික චාතාවත් ඉටු කිරීමට පූජකයින්ගේ පරිහණය සඳහා භාවිත වන්නට ඇත.
- ධාන්‍ය ගබඩා කිරීමට විශාල ගොඩ නැගිල්ලක් ඉදි කොට ඇත.
- මෙහි මධ්‍යයේ චක්‍රාකාර කොටසක් ඇති අතර එය ධාන්‍ය කෙටීමට භාවිත කර ඇත.
- පොදු ඉදිකිරීම් අතර සොහොන් බිම්ද දක්නට ඇත.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ජල පරිවහන පද්ධති

- උස් ප්‍රදේශයක සිට ආයත චතුරස්‍රාකාර ලිඳක සිට 'ඇක්විඩක්ට්' නම් ජල මග ඔස්සේ තටාකයට ජලය ගෙන ඇත.
- උමගක් සේ වූ මෙම ජල පරිවහන පද්ධතියේ පැන්නුම් ආරුක්කුව නම් විශේෂ ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රමයක් දැකිය හැකිය.

**'ඉ' කොටස**

**(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)**

**6.** යුරෝපයේ සදාසත්න රාජ්‍යයන් දෙකක් වන ග්‍රීසිය හා රෝමය කලා නිර්මාණ රැසක් ලොවට දායාද කළ දේශයන් විය.

(i) ග්‍රීක සම්භාව්‍ය යුගයේ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

- කවපෙත්ත විසිකරන්නා
- හෙල්ල විසිකරන්නා
- හෙල්ල දරන්නා
- ඇතීනා දෙවඟන
- හර්මීස් සහ ඩයොනීසස්
- ඩෙල්ෆ් හි රථාචාර්යයා
- දිව්‍යාංගනාවන් තිදෙනා

• නිකියස්
• ඩොරිෆෝරස්,
• ඔලිම්පික් ක්‍රීඩකයා
• ඇපලෝ

(ii) රෝම වාස්තු විද්‍යාවේ සුවිශේෂී නිර්මාණයක් වූ ට්‍රාජන් කුලුණ (The Trajan Column) ගැන කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

- ට්‍රොජන්ගේ බැසිලිකා මැදුරට යාබද ට්‍රාජන් අධිරාජයාගේ ඩේසියානු (DECIAN) යුධ ජයග්‍රහණ සැමරීමට ඉදිකර ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණයකි.
- ක්‍රි.ව 107 - 113 කාලයේදී ඇපලෝඩෝරස් නම් කලාකරුවා විසින් නිර්මාණය කර ඇති බව රෝමවරුන්ගේ ලෝකය නැමති ග්‍රන්ථයේ සඳහන් කර ඇත.
- කුලුණු බඳ අඩි 98 ක් වන අතර පාදම සමග උස අඩි 125 ක විශ්කම්භය අඩි 12.2 කි.
- මෙහි කුළුණු බඳ නිර්මාණයට සිලින්ඩලාකාර කිරිගරුඬ ගල් කුට්ටි 20 ක් භාවිත කර ඇති අතර, එකක බර ටොන් 323 පමණ වේ.
- ඩොරික් කුළුණු ස්වරූපයට ඉදිකර ඇති මෙම ස්ථම්භයේ අඟල් 50 ක් පමණ පළලින් යුතු රූපාවලියක් සර්පිලාකාරව ඉහලට විහිද යන අයුරින් කැටයම් කර ඇත.
- අධිරාජයාගේ යුධ දර්ශන බලකොටු, යුධ ගමන් හා චාරිකා නානාපතිවරුන් හා සිරකරුවන් තේමා වූ මෙම කුලුනේ මානව රූප 2500 ක් පමණ වෙලුම් 24 ක් තුළ කැටයම් කර ඇත.
- නිරූපිත සිද්ධි එකිනෙකට ගලපමින් තලය පිරී යන සේ අර්ධ උන්නතව, අඛණ්ඩ කථන ශෛලියෙන් යුක්තව රචනා වීම ශිල්පීය දක්ෂතාවය පෙන්වන්නකි.
- කුළුණු පාදමේ ට්‍රාජන් හා ඔහුගේ මෙහෙසිය වන ෆ්ලොටිනාගේ සොහොන් ගැබට පිවිසෙන දොරටුවකින් යුක්ත වන අතර, අභ්‍යන්තරයේ සිට ඉහළට නැගීමට සර්පිලාකාර පඩි පෙළකි.
- කුළුණ මුදුනත ට්‍රාජන් අධිරාජයාගේ මූර්තියක් නිර්මාණය කර ඇත.

(iii) ග්‍රීක හා රෝම ශිල්පීන් මානව රූපය, සිතුවම් සඳහා යොදා ගත් ආකාරය හා අවස්ථාවන් ඇසුරෙන් සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

- ග්‍රීක හා රෝම කලා සම්ප්‍රදායන් ද්විත්වයම මිනිසා කේන්ද්‍ර කරගත් දර්ශනයක් මත පදනම් වූවත් මානව රූපය නිරූපණය කළ අකාරයෙහි සහ එය යොදාගත් අවස්ථාවන්හි සුවිශේෂිතා වෙයි.

- ග්‍රීක සිතුවම්හි මානව රූප නිරූපණයේ දී දේවත්වයට හෝ වීරත්වයට සමීප වූ තාරුණ්‍ය, කායිකව ශක්තිමත් සහ සම්පූර්ණ සමානුපාතික රූප නිරූපණය කර ඇති අතර, රෝම සිතුවම්හි මානව නිරූපණයේ දී සැබෑ මිනිසුන්, ඔවුන්ගේ සහ ඔවුන්ගේ වයස යන පෞද්ගලික ලක්ෂණ සහිතවය.

- ග්‍රීක සිතුවම්වල විශේෂයෙන් ම පිරිමි රූප (ක්‍රීඩකයන්, වීරයන්, දෙවිවරුන්) නිරූපණය තුළදී අලංකාරය , වීරත්වය සහ උත්තරීතරත්වය සංකේතවත් කරයි. (ග්‍රීක මල් බඳුන්වල දැකිය හැකි චිත්‍ර)

- රෝම සිතුවම්වලදී චිත්තවේගයන්, දුක් වේදනා විශේෂයෙන් පෞද්ගලික සිදුවීම් (දැව ඵලකය මත ඇඳි කාන්තා උඩුකය) මෙන්ම මිත්‍යා කථා හා ඇදහිලි පූජා විධි (ඩයොනිසස් පිදීම) සිතුවම්කරණයට භාජනය විය.

- මෙහිදී මානව රුව නිරූපණයේදී ග්‍රීකයේ ශෛලීගතබවත් රෝම සිතුවම්වලදී ස්වභාවික නිරූපණයක් හා ත්‍රිමාණ ස්වරූපයෙන් ඉදිරිපත් කිරීමත් දැකිය හැකිය.

- පොම්පෙ විලා අයිටම් හෙවත් විලා මිස්ටරීස් නමින් හඳුන්වන ගොඩනැගිල්ලෙහි සිතුවම් වන ඩයොනීසියස් පිදීම ආගමික දර්ශනයක් ඇතුළත් සිද්ධිය තුළදී නිරුවත් මෙන්ම අඩ නිරුවත් කාන්තා රූප නිරූපණය සුවිශේෂී වන අතර, ග්‍රීක කාන්තා රූප නිරූපණය තුළදී නග්නව යෙදීම දැකිය නොහැකි අවස්ථා බොහෝ වෙයි.

- ග්‍රීක මානව රූප පරමාදර්ශී කළ අතර, රෝමවරු යථාර්ථවාදී කරනු ලැබීය.



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

| | ග්‍රීසිය | රෝමය |
|---|---|---|
| සිතුවම් දැකිය හැකි අවස්ථා | <u>මැටි බඳුන්</u><br>• කාලරූපි මැටි බඳුන්<br>• රක්ත රූපි මැටි බඳුන් (ඇම්පෝරා හයිඩ්‍රියා කයිලික්ස්, කන්තරෝස්, ලෙකිතෝස්)<br>• පනේල සිතුවම් (දැවමය)<br>• බිතු සිතුවම් - මන්දිර තුළ | <u>මානව දේහ වැසුම්</u><br>• ස්කොට්ලන් රාජකීය කෞතුකාගරයේ තැන්පත් කර ඇති කාන්තා උඩුකය රුව<br>• බිතුසිතුවම් (ප්‍රභූ නිවාස අලංකාර)<br>• ආගමික දර්ශන පොම්පෙයිවිලා මිස්ටරීස් ගොඩනැගිල්ල |
| භාවිත තේමා (වස්තු විෂය) | මිත්‍යා කථා, වීර කථා, යුධ දර්ශන, නැටුම් දර්ශන, ක්‍රීඩා දර්ශන | පාලකයින්ගේ ජයග්‍රහණ දර්ශන<br>පුද්ගල ආලේඛ්‍ය චිත්‍ර<br>මිත්‍යා කතා, භූ දර්ශන<br>ආගමික දර්ශන |
| මානව රූප නිරූපණය කර ඇති අයුරු | ද්විමාණ බවකින් යුතුය. (2 D)<br>රේඛීයත්වය (LINEARTY) සහ පැතලි ආකෘති කෙරෙහි අවධානය යොමු කිරීම.<br>ශෛලිගත බවකින් යුතුය<br>ක්‍රියාකාරී බවින් අඩුය. | ත්‍රිමාණ බවින් යුතු (3 D)<br>ගැඹුරු බව දැක්වීම, පර්යාලෝක ලක්ෂණ සෙවනැලි සහ ආලෝක යෙදීම.<br>යථාර්ථවාදී ලක්ෂණ දැක්වීම උසස් හැඟීම් ප්‍රකාශනය, මානව රූප ජීවී ප්‍රමාණයෙන් සහ රිද්මයානුකූලව දැක්වීම. |
| තලය භාවිතය | පාරිභාරික භාණ්ඩ තුළ වක්‍ර පෘෂ්ඨ භාවිත කිරීම | ගොඩනැගිලි තුළ මානව රූප පැතලි පෘෂ්ඨයක නිරූපිතය |
| වර්ණ භාවිතය | රක්ත හෝ කාල වර්ණ | දීප්තිමත් වර්ණ භාවිතය |
| රේඛාව | මැටි බඳුන් සියුම් ලෙස සූරා රේඛා මතු කරයි. | සියුම් රේඛාකරණය වස්ත්‍ර නිරූපණයේදී භාවිත කරයි. |

7. ඉතාලියේ බිහි වූ පුනරුද සමය, අග්‍රගණ්‍ය කලා කෘති රැසක් ලොවට බිහිකළ අවධියකි.

(i) මයිකල් ඇන්ජලෝ විසින් නිර්මාණය කරන ලද සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

- අවසාන විනිශ්චය (LAST JUDGEMENT)
- ශුද්ධ වූ පවුල (HOLY FAMILY)
- සිස්ටයින් දෙව් මැදුරේ සිවිලිමේ ඇඳ ඇති ලෝකෝත්පත්ති කතාව
  - ආදම් මැවීම - නෝවාගේ බීමත්කම
  - ජීව මැවීම - මහා ජල ගැල්ම
  - පාරාදීසයෙන් නෙරපීම - නෝවාගේ පරිත්‍යාගය
  - අඳුරෙන් එළිය වෙන් කිරීම - ඉර, හඳ, තරු මැවීම
  - ජලයෙන් ගොඩබිම වෙන් කිරීම

(ii) පුනරුද කලාවේ පොදු ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)

- පුනරුද සමයේ මානවාදය, පුද්ගලවාදය, පරමාදර්ශිවාදය, ස්වාභාවිකවාදය යන ප්‍රවේශ ප්‍රමුඛත්වයට පත්වීම.
- ග්‍රීක, රෝම සම්භාව්‍ය කලාවේ තේමා හා සංකේත කලා කරුවන් අතර ප්‍රකටව භාවිතා වීම.
- භූමි දර්ශන කලාව පුනරුදය සමඟ දියුණු වූ විෂයක් වීම
- ස්වාභාවිකවාදය දියුණුවීමේ ප්‍රතිඵලයක් ලෙස, ස්වභාවික ලෝකය හැකිතාක් තථ්‍ය ස්වරූපයෙන් ගොඩනැගීම.
- මෙහි ප්‍රතිඵලයක් ලෙස පර්යාවලෝක මූලධර්ම උපක්‍රම දියුණු වීම
- මිනිස් සිරුර ඉතා නිවැරදිව හා ප්‍රශස්තව ඇඳීම පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමත් ඒ අනුව කායව්‍යුහ (Anatomy) ලක්ෂණ හා පරිමාණ ලක්ෂණ (Propotions) අධ්‍යනයට නැඹුරු වීම.
- පුද්ගලරූප (ආලේඛ්‍ය චිත්‍ර) කලාව ප්‍රචලිත වීම



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) ලියනාඩෝ ඩාවින්චිගේ 'පර්වත මස්තකයේ දේවමෑණියෝ' සහ රෆායෙල් සැන්සියෝගේ 'ඇල්බා මැඩෝනා' යන සිතුවම් පිළිබඳ ආකෘතිය හා කලා ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

| පර්වත මස්තකයේ දේව මෑණියන් සිතුවම | ඇල්බා මැඩෝනා සිතුවම |
|---|---|
| **ආකෘතිය**<br>• ක්‍රි.ව 1483 - 1508 කාලයට අයත් ප්‍රංශයේ ලූවර් කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.<br>• ඉහළ පුනරුද කලාවට අයත් කලා කෘතියකි.<br>• අභිරහස් සිතුම් ස්වභාවිකත්වය හා ගැඹුර අවධාරණය කරන පරිදි චිත්‍රය සංරචනය කර ඇත.<br>• සිතුවම තුළ කන්‍යා මරිය තුමිය, ජේසු බිළිඳු, බැප්ටිස්ට් ජෝන් සහ දේවදූතයකු දැක්වෙන මානව රූප හතරකින් යුතු සංරචනයකි. අභිරහස් හා අන්තර් සම්බන්ධිත ස්වරූපයක් ගනී.<br>• සංකීර්ණ පිරමීඩාකාර ව්‍යුහයක් නිරූපණය වේ. සිතුවම තුළින් කන්‍යාමරියතුමියගේ ඇඟිලි දැක්වීම හා ජේසු බිළිඳා සඳහා වඩා ඇඟිල්ල සිය පාර්ශවයක් නොමැතිව සිද්ධියක් වඩ උපමාකාරයෙන් විද්‍යා දැක්වෙන බව විචාර මතයයි.<br>• රූප ගැඹුර, ලෙන්ගෙට් වැනි ඇ දර්ශනයක් තුළ තැන්පත් කර ඇති අතර, භූ විද්‍යාත්මක හා ආධ්‍යාත්මික අභිරහසක් පිළිබඳ හැඟීමක් ඇති කරයි. | **ආකෘතිය**<br>• ක්‍රි.ව 1510 -1511 අයත් ය.<br>• වොෂින්ටන් ජාතික කෞතුකාගාරයේ තැම්පත් කර ඇත.<br>• ඉහළ පුනරුද කලාවට අයත් කලා කෘතියකි.<br>• පරමාදර්ශී සුන්දරත්වය, නැණැලි සහ සුසංයෝග සංයුතිය ප්‍රකාශ කරයි.<br>• මෙම සිතුවමෙහි ජේසු බිළිදා, බැප්ටිස්ට් ජෝන් හා මරියතුමිය යන තිදෙනා දැ විශය වේ.<br>• සිතුවම සංරචනය කර ඇත්තේ තොන්ඩෝ ව්‍යුහයක.<br>• මානව රූප ත්‍රිකෝණාකාර ආකෘතියක් තුළ නිර්මාණය කර ඇත.<br>• මුල් පිටපත දැව පලකයක් මත නිර්මාණය කර ඇත. පසුකාලීන සිතුවම කැන්වස් මතුපිටකට ගෙන ඇත. |
| **කලා ලක්ෂණ**<br>• ආලෝකය වර්ණ සිදු ලෙස මතු කර දැක්වීම පෙන්වන කියරොස්කුරෝ (Chiaroscuro) වර්ණ ශිල්ප ක්‍රමය අනුව තෙල් සායම් භාවිත කරමින් චිත්‍රනය කර ඇත.<br>• මෙම සිතුවමෙහි පෙරබිම, මැදබිම, පසුබිම හා දාශ කලා මූලිකාංග භාවිතයෙන් මනාව ගොඩ නගා ඇත. ඒ තුළින් ගුප්ත හා අද්භූත ජනක හැඟීමක් ජනිත කරයි.<br>• කරුණාව, දයාව සහ මානුෂත්වය මැනවින් පෙන්වන අතර, දර්ශ සහිත ෆුමදෙලා බවින් යුත් කල්පනික (Fantasy) ස්වරූපයක් සමස්ථ සිතුවම තුළ නිරූපණය කරයි. | **කලා ලක්ෂණ**<br>• ඇතැම් ප්‍රිය සොම්නස වර්ණ භාවිත කර කියරොස්කුරෝ ශිල්ප ක්‍රමය අනුව තෙල් සායම් සිතුවම වර්ණ ගන්වා ඇති හාඩුමෙම ලක්ෂණ ද අන්තර්ගත වේ.<br>• ඉතාලියානු ගම්බද පරිසරයක ස්වභාව සොබා තලයින් පෙරබිම, මැදබිම හා පසුබිම ලෙස තලය නිර්මාණය කර ඇත.<br>• අසීමෙයන්සීයන රශ්මි මණ්ඩලය, ද්‍රෂ්ටියක් හා ආලෝක ධාරා නැතැර හා ප්‍රකාශී ලෝකයේ මනුෂ්‍ය ස්වරූපයෙන් මෙම සිතුවම නිර්මාණය කර ඇත.<br>• දරුවන්ගේ මොළොකැටිබව, මරියතුමියගේ කරුණාව, ජේසු බිළිදාගේ මුහුණින් පෙන්වන කල්පනාකාරී බව මනාව නිරූපණය කරයි. |

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

51 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලිව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසියේ තලය, අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
* ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ සැලකිලිමත් වන්න.
* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.
* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.
* ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිතව හෝ භාවිත කළ හැකි ය.

* * *

PAST PAPERS WIKI



අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සැලකිය යුතුයි.

*චිත්‍ර කලාව 11 හා 111 පත්‍ර සඳහා පිළිතුරු සැපයීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඔබ වෙත සපයා ඇති අනුහුරු අභ්‍යාස පොත පරිශීලනය කිරීමෙන් ගුණාත්මක ඇගයීමක ප්‍රවේශයක් හා උපදේශනයක් ලබාගත හැකිය. එහි දක්වා ඇති උදාහරණ අනුව ලකුණු ප්‍රදානය කිරීමේ දී නිර්ණායක පදනම් කර ගැනීම අත්‍යවශ්‍ය වේ.*

## 11. පත්‍රය - නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

අභිමතාර්ථ

1 - ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රමශිල්ප භාවිතය මැන බැලීම.

2 - රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය වන සේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.

3 - වර්ණ භාවිත කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

11. වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙහිදී ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ දී අදාළ නිර්ණායකයන් යටතේ ම ලකුණු තීරණය කළ යුතු වේ. එකිනෙක නිර්ණායකයන් යටතේ අපේක්ෂකයා කොතෙක් දුරට ළඟා වී ඇත්දැයි නිවැරදි තීරණයකට එළඹී ලකුණු තීරණය කළ මැනවි. මෙහි දී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීම කළ යුතු වේ.

### ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු 20 |
| 2 - | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 20 |
| 3 - | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | - ලකුණු 20 |
| 4 - | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 20 |
| 5 - | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | - ලකුණු 20 |
| | 11. වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු | - ලකුණු 100 |





Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව III
சித்திரம் III
Art III

**51 S III**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.
- දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.
- අවශ්‍ය අයට විෂු කඩදාසි සපයනු ලැබේ.
- චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන් ම වියළී තිබිම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් අ, ආ සහ ඉ යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් **පමණක්** තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. රිළවුන් රංචුවකට මැදි වූ සංචාරකයින් පිරිසක්
2. ගැමි පරිසරයක වෙලි නාට්‍යයක් රඟන කරන අවස්ථාවක්
3. දන්සලක ඔබ සිත්ගත් අවස්ථාවක්
4. දැඩි වර්ෂාව හා සුළඟින් පීඩා විඳින පදිකයින්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. විෂ්කම්භය අඩි 4ක් වූ වෘත්තාකාර මේසයකට සුදුසු පැත්තක් අඩි 6ක් වූ සමචතුරස්‍රාකාර මේස රෙද්දක් මධ්‍ය ලක්ෂ්‍යය පාදක කොට ගෙන වෘත්තාකාරව විහිදී යන අයුරින් මුළුතල මෝස්තරයක් සාම්ප්‍රදායික උද්භිද හා සත්ත්ව හැඩතල ඇසුරෙන් සැලසුම් කර වර්ණ කරන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)
6. යානවාහනවල හැඩතල කිහිපයක් මෝස්තර ඒකකයක් ලෙස භාවිත කර කමිස රෙද්දක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් 9" × 9" (අඟල්) ප්‍රමාණයට සැලසුම් කර වර්ණ ගන්වන්න.
7. ජලජ ජීවී සංරක්ෂණ ජාතික මට්ටමේ වැඩමුළුවක පිවිසීමේ දොරටුව ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට උචිත 6' × 12' (අඩි) ප්‍රමාණයේ පතාකයක් සැලසුම් කර වර්ණ ගන්වන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

8. 'අහිමි සෙනෙහස' නමින් ලියැවුණු නිසඳැස් කවි පෙළක් සඳහා එහි අන්තර්ගතය විග්‍රහ වන පරිදි සන්නිදර්ශන චිත්‍රයක් ව්‍යුක්තරූපී හැඩතල ඇසුරෙන් නිර්මාණය කරන්න.
9. 'ප්‍රාග් ඓතිහාසික චිත්‍ර කලාව' නමින් ලියැවුණු පොතකට සුදුසු පිට කවරයක් සැලසුම් කර වර්ණ කරන්න. (මුල් පිටුව, ඝනකම හා පසු පිටුව ඇතුළත් විය යුතු ය.)
10. දේශීයව නිෂ්පාදිත කාන්තා සුවඳ විලවුන් බෝතලයක් විදේශීය වෙළෙඳපොළට හඳුන්වාදීමට උචිත ආකාරයේ ඇසුරුමක් විකසනය දැක්වෙන අයුරින් සැලසුම් කර වර්ණ ගන්වන්න.

* * *



අ.පො.ස. උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න